# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 126 ව්‍යවස්ථාවන් යටතේ කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වූ කාරණය සම්බන්ධයෙනි.

නිහාල් ශ්‍රී අමරසේකර,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

**පෙත්සම්කරු**

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක. මු.අ 194/2003

- එදිරිව -

01. රනිල් වික්‍රමසිංහ,
නීතිඥ අග්‍රාමාත්‍ය ප්‍රතිපත්ති සංවර්ධන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය,
අරලියගහ මන්දිරය,
කොළඹ 03.

02. කයිර්ශාෂ්ප් නර්මාන් චොක්සි,
ජනාධිපති නීතිඥ
මුදල් අමාත්‍ය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

03. බන්දුල ගුණවර්ධන,
නියෝජ්‍ය මුදල් අමාත්‍ය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

04. මිලින්ද මොරගොඩ,
ආර්ථික ප්‍රතිසංවිධානය, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය සහ ප්‍රතිපත්ති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍ය අමාත්‍ය,
561/3, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

05. චරිත රත්වත්තේ,
ලේකම්,
මුදල් අමාත්‍යංශය මහ භාණ්ඩාගාරය සහ ලේකම්,
ප්‍රතිපත්ති සංවර්ධන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශය,
මහලේකම් කාර්යාලය,කොළඹ 01.

06. රාමලිංගම්, පාස්කරලිංගම්,

අග්‍රාමාත්‍යවරයාගේ සහ ප්‍රතිපත්ති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයාගේ උපදේශක,
319 කාමරය, 3වන මහල,
මහලේකම් කාර්යාලය, කොළඹ 01

07. ගාමිණි ලක්ෂ්මන් පීරිස්,
නීතිය පිළිබඳ මහාචාර්යය,
ව්‍යාපාර සංවර්ධනය කර්මාන්ත ප්‍රතිපත්ති ආයෝජනය ප්‍රවර්ධනය සහ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය,
73/1, ගාළුපාර, කොළඹ 03.

08. රංජිත් ප්‍රනාන්දු,
ව්‍යාපාර සංවර්ධනය, කර්මාන්ත ප්‍රතිපත්ති ආයෝජන ප්‍රවර්ධනය සහ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්,
73/1, ගාළුපාර,
කොළඹ 03.

09. වි.ජ.මු. ලොකු බණ්ඩාර,
නීතිඥ, අධිකරණ, නීති ප්‍රතිසංවිධානය සහ ජාතික සම්බන්ධීකරණ අමාත්‍ය,
උසස් අධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

10. ධාරා විජේතිලක,
නීතිඥ, අධිකරණ, නීති ප්‍රතිසංවිධානය සහ ජාතික සම්බන්ධීකරණ අමාත්‍යාංශයේ ලේකම්,

11. ජෝෂප් මයිකල් පෙරේරා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක,
" මුන්ටාස් මහල " , ගාළුපාර,
කොළඹ 03.

12. පියානි විජේසේකර,
නීතිඥ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ලේකම් ජෙනරාල්වරිය,
පාර්ලිමේන්තු සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

13. තෙරීස් ආර්.පෙරේරා,
නීතිඥ නීති කෙටුම්පත් සම්පාදක,
උසස් අධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

14. කන්දයියා සුසිලාර්,
දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්වරයා,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත, කොළඹ 02.

15. එස්.ඒ.සී.එස්.ඩබ්.ජයතිලක,
රේගු අධ්‍යක්ෂක ජෙනරාල්,
රේගු නිවාසය, බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 01.

16. පරාක්‍රම ඒකනායක බණ්ඩාර,
සුරාබදු අධ්‍යක්ෂ ජෙනරාල්,
ස්ටේපල්ස් වීදිය,
කොළඹ 02.

17. එච්.ඒ.ජී.හෙට්ටිආරච්චි,
විනිමය පාලක ශ්‍රී ලංකා මහ බැංකුව,
7වන මහල, පස්වන කුළුන,
ජනාධිපති මාවත, කොළඹ 07.

18. රන්ජන් සමරවීර,
ආනයනය සහ අපනයන පාලක,
75 1/3, 1 මහල, හේමාස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය,
කොළඹ 01.

19. ඒ.එස්.ජයවර්ධන,
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,
ශ්‍රී ලංකා මුල්‍ය මණ්ඩලයේ සභාපති,
15වන මහල, 1වන කුළුන,
30, ජනාධිපති මාවත, කොළඹ 01.

20. ආනන්ද කුමාරස්වාමි,
හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
අල්ලස් හා දූෂණ පිළිබඳ චෝදනා, විමර්ශණය කිරීමේ කොමිෂන් සභාවේ සභාපති,
36,මලලසේකර මාවත,කොළඹ 01.

21. කේ.සී.කමලසබේසන්,
ජනාධිපති නීතිඥ ගරු නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

<u>වගඋත්තරකරුවන්</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු කටයුතු අග විනිසුරු තුමා වෙත සහ අනිකුත් විනිසුරුතුමන්ලා වෙත ඔප්පු කිරීම පිණිසයි.

වර්ෂ 2003ක්වූ අප්‍රේල් මස 14 වන දින දිය.

**ආබ්දීන් ඇසෝෂියේට්ස්** යන නාමය හා විලාශය යටතේ වෘත්තිමය කටයුතු කරන නීතීඥ රාස්මාරා ආබ්දීන් සහ ඔහුගේ සහයකයන් වන නීතීඥ අමරසිංහගේ ප්‍රියන්ත උපාලි අමරසිංහ, නීතීඥ ලිලාන් ඉන්දිත් වීරසූරිය, නීතීඥ බුෂ්රා මුහිසා හෂිම් මෙනවිය සහ නීතීඥ මංජුලා පැස්කුවල් මහත්මිය මගින් පෙනී සිටින ඉහත නම් සඳහන් පෙත්සම්කරු සිය **පෙත්සමේ** මෙසේ ප්‍රකාශ කර සිටියි.

01. පෙත්සම්කරු-

(අ) (මෙහි මින්මතු " ශ්‍රී ලංකාව" යනුවෙන් සඳහන් කරුනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකි.

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහ එක්සත් රාජධානියේ කළමණාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි-සාමාජිකයෙකි.

(ඇ) ලෝක බැංකුවේ සහ USAID ආයතනය විසින් මූල්‍යය සම්පාදනය කෙරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආර්ථික පසුතල පහසුකම් ප්‍රතිව්‍යුහකරණ ව්‍යාපෘතිවල ජ්‍යෙෂ්ඨ උපදේශක වශයෙන් සහ මුදල් අමාත්‍යාංශයේ උපදේශකයකු ලෙස කටයුතු කර ඇති දැනට ආර්ථික උපදේශකයකු ලෙස වෘත්තියෙහි යෙදෙන්නෙකි.

(ඈ) උපදෙස් ලැබී ඇති පරිදි, 2003.01.31 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාවූද, පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවේ නම් උද්දේශිත වූද, **"දේශිය ආදායම් (විශේෂ විධිවිධාන) පනත"** යන අභිධානයෙන් යුත් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තමා වෙනුවෙන්ම සහ ජාතික සහ මහජන යහපත වෙනුවෙන් මෙම පෙත්සම ඉදිරිපත් කර සිටී.

02. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 53වන සහ/හෝ 61වන සහ/හෝ 165 වන ව්‍යවස්ථාව අනුව, 1 සිට 21 දක්වා වූ වගඋත්තරකරුවෝ එක් එක් අයෙකු වෙනුවෙන් ඉහත නඩු ශිර්ෂයේ විස්තර කර ඇති රාජ්‍ය පදවිවල ධුර දරන්නන් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය අනුව තම තමන්ගේ රාජ්‍ය ධුරවල කාර්යයන් අවංකව ඉටු කිරීමට බන්ධනය වී සිටින අතර, ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාත වන බවටද, ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවටද ව්‍යවස්ථාවේ හතර වන උපලේඛනයට අනුව දෙන ලද ගාම්භීර රාජකාරී දිවුරුම්/ප්‍රතිඥාව අනුව සහ ඒ යටතේ බැඳී සිටිති. තවද, 1වන, 2වන, 3වන, 7වන, 9වන හා 11වන වගඋත්තරකරුවෝ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වශයෙන්ද ව්‍යවස්ථාවේ 63වන ව්‍යවස්ථාව අනුව, ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කිරීමට තවදුරටත් බැඳී සිටිති.

(ආ) තවද, පෙත්සම්කරු ගෞරවයෙන් කියා සිටින්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107වන ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට අනුව අධිකරණ ධුරයේ කර්තව්‍ය අවංකව ඉටු කිරීමට ගරු කටයුතු ඔබඋතුමන්ලා බැඳී සිටින අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන උපලේඛනයේ නියමයන් අනුව ගන්නා ලද ගාම්භීර නිල දිවුරුම්/ප්‍රතිඥාව ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාත වන බවටද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවටද බන්ධනය වී සිටින බවය.

03. (අ) 21වන වගඋත්තරකරු වන ගරු නීතිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77වන

ව්‍යවස්ථාව අනුව,

(i) 82වන ව්‍යවස්ථාවේ (1)වන අනු ව්‍යවස්ථාවේ සහ (2)වන අනු ව්‍යවස්ථාවේ දැක්වෙන නියමයන් කඩ වී ඇත්තේද යන වගද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කොට ඇති විශේෂ බහුතර ඡන්දයෙන් **විනා නීත්‍යානුකූලව සම්මත කළ නොහැකි විධි විධාන ඇතුළත් වී ඇත්තේද**, යන වගද දැන ගැනීම පිණිස සැම පනත් කෙටුම්පතක්ම පරීක්ෂා කර බැලිය යුතුය.

(ii) යම්කිසි පනත් කෙටුම්පතකින් 82වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ සහ (2) වන අනු ව්‍යවස්ථාවේ දැක්වෙන යම් කිසි නියමයන් කඩ වී ඇති බව නීතිපතිවරයාගේ මතය වේ නම්, නැතහොත් යම්කිසි පනත් කෙටුම්පතක යම්කිසි විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කොට ඇති විශේෂ බහුතර ඡන්දයෙන් විනා **නීත්‍යානුකූලව සම්මත කොට නොගත හැකි බව ස්වකීය මතය වේ නම්, නීතිපතිවරයාගේ ඒ මතය ඔහු විසින් ජනාධිපතිවරයාට දන්වා යැවිය යුත්තේය.** එසේ වුවද, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් වන විට, ඔහුගේ මතය, නීතිපතිවරයා විසින් ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම්ව ඇති අවස්ථාවේදී **කථානායක වෙත දන්වා යැවිය යුත්තේය.**

(ආ) ඉහත දැක්වෙන කරුණු ඉටු කිරීම පිණිස, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර සැම කෙටුම්පත් පනතක්ම, ඒ කෙටුම්පත් පනතේ කිසිදු විධි විධානයක් ප්‍රතිවිරුද්ධ නොවන බව මතය වූ විට, පරීක්ෂා කර බැලීමෙන් පසු එලෙස ප්‍රතිවිරුද්ධ නොවන බවට 21වන වගඋත්තරකරු විසින් සහතික කළ යුතු බව පෙත්සම්කරු තදින්ම විශ්වාස කරයි.

04. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වන වගන්තිය ප්‍රකාරව, යම් කෙටුම්පත් පනතක් **පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කිරීමට යෙදුනු බවට** 11වන වගඋත්තරකරු වන පාර්ලිමේන්තුවේ කථානායකවරයා විසින් සහතිකයක් නිකුත් කිරීම අත්‍යවශ්‍යය.

(ආ) කෙටුම්පත් පනතක් එසේ යථා පරිදි සම්මත වූ බවට කෙරෙන එවැනි සහතික කිරීමකට ආවේනික නිගමනය නම් **ඒ කෙටුම්පත නීත්‍යානුකූලව සහ/හෝ නීතියට අනුව සහ/හෝ ව්‍යවස්ථානුකූලව සම්මත වී තිබෙන බව** සහ එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසිදු විධි විධානයකට ප්‍රතිවිරුද්ධ නොවන බවය. මක් නිසාද යත්, 11වන **වගඋත්තරකරු වන කථානායකවරයා ඉහත කී පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට බන්ධනය වී සිටින හෙයිනි.**

05. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75වන ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ එහි යම් කොටසක් ක්‍රියාත්මක වීම **අත්හිටුවමින්** යම් නීතියක් සෑදීමෙන් වලක්වාලනු ලැබ ඇත.

06. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තිය යටතේ,

- **සම්පූර්ණ සමාවක් දීම,**
- **නීත්‍යානුකූල කොන්දේසි සහිත සමාවක් දීම,**
- **ඒ අඩුවම වෙනුවට ලිහිල් දඩුවමක් ආදේශ කිරීම හෝ**
- **නියම කරන ලද කිසියම් දඩුවමක් හෝ දණ්ඩනයක් හෝ එහි කිසියම් කොටසක් මුළුමනින්ම නිෂ්ප්‍රභා කිරීම හෝ ඉන් කොටසක් අඩුකිරීම,**

පිණිස ව්‍යවස්ථානුකූල බලය පවරා ඇත්තේ ජනාධිපතිවරයාට පමණකි. අන් කවර වූ හෝ තැනැත්තෙකුට නොවේ.

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් පෙත්සම්කරු පහත සඳහන් කරුණු සඳහා හිමිකම් තිබෙන බව පෙත්සම්කරු කියා සිටී:-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණයද පිළිබඳ සර්ව සාධාරණත්වය,

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) ව්‍යවස්ථාව ප්‍රකාරව භාෂණයේ නිදහසට සහ අදහස් පළකිරීමේ නිදහසට.

08. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28වන ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන්, වෙනත් දේ අතර පහත දැක්වෙන මූලික යුතුකම් ඉටු කිරීමට හිමිකම් තිබෙන බව පෙත්සම්කරු කියා සිටී:-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂා කිරීමට හා අනුගමනය කිරීමට,

(ආ) ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීමට,

(ඇ) තමන් විසින් තෝරා ගනු ලැබූ රැකියාවෙහි හෘද සාක්ෂියට අනුව වැඩ කිරීමට, සහ

(ඇ) පොදු දේපල සුරක්ෂිත කොට ආරක්ෂා කිරීමට හා අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීම සහ නාස්ති කිරීමට විරුද්ධව ක්‍රියා කිරීමට,

09. උපදෙස් ලැබ් ඇති පරිදි පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කර සිටී:-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාව ජනතාවගේ පරමාධිපත්‍යය ගැන කටයුතු කෙරෙන ආරක්ෂිත විධිවිධානයක් වන අතර, එහි කියවෙන්නේ මෙසේය,

**" 3. ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය. පරමාධිපත්‍යය අන්සතු කළ නොහැක්කේය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලයද ඇතුලත් වන්නේය. "**

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4වන ව්‍යවස්ථාව මගින්, වෙනත් දේ අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආණ්ඩුවේ සියළු ආයතන විසින් ගරු කළ යුතු බවට ආරක්ෂා කල යුතු බවට සහ ප්‍රවර්ධනය කළ යුතු බවට ප්‍රකාශ කර ඇති සහ පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් විධිමත් කරනු ලැබ ඇත. එසේම ඒවා සංක්ෂිප්ත කිරීම සීමා කිරීම හෝ **අහිමි කළ** නොහැකි වන අතර, මූලික අයිතිවාසිකම් සහ ආණ්ඩුවේ බලතලද ඇතුළුව ජනතාවගේ පරමාධිපත්‍යය අත්හල නොහැක්කේය.

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාව 4වන ව්‍යවස්ථාව සමඟ එකට බැඳී පවතින බවට ඔබතුමන්ලාගේ ගරු අධිකරණය විසින් තීරණය කර ඇති බැවින් ඒවා එකට ගෙන කියවිය යුතුය.

10. රජයේ ප්‍රතිපත්තිය සහ මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් නිර්වචනය කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27වන වගන්තියෙන් නියම කරනු ලබන්නේ මෙසේය:-

(අ) ආණ්ඩු ව්‍යවස්ථාවේ අඩංගු රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම, ධර්මිෂ්ඨ නිවහල් සමාජයක් ඇතිකිරීම සඳහා **නීති පැනවීමේදීද** ශ්‍රී ලංකාවෙහි රාජ්‍යානුශාසනයෙහිදීද

පාර්ලිමේන්තුව, ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය වෙත <u>මඟ පෙන්වනු ලබනු ඇත.</u>

(ආ) පහත දැක්වෙන අරමුණුද ඇතුළත්ව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී සමාජයක් ශ්‍රී ලංකාවෙහි ඇති කිරීමට රජය ඇපකැපවී ඇත්තේය.

(i) **සියළු තැනැත්තන්ගේම මූලික අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස සපුරාලීම,**

(ii) **ජාතික ජන ජීවිතයේ සියළු ආයතන විසින් සමාජ, ආර්ථික හා දේශපාලන සාධාරණත්වය ගුරුකොට ගන්නා සමාජ ක්‍රමයක් හැකිතාක් සාර්ථකව ඇතිකර ආරක්ෂා කර දීමෙන් ජනතා සුභ සිද්ධිය වර්ධනය කිරීම,**

(iii) **ප්‍රමාණවත් ආහාර පාන ඇඳුම්, පැළඳුම් සහ නිවාස පහසුවද ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනයද විවේචනය හා සමාජයීය සහ සංස්කෘතික ඉඩ ප්‍රස්ථා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීමද ඇතුළුව ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියළු පුරවැසියන් විසින් තමන්ට සහ තම පවුල්වල සාමාජිකයන්ට අත්කර දැමීම,**

(iv) රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාවලියක් තුළින් සහ එකී ආර්ථික ක්‍රියාවලිය **රටේ සමාජ අරමුණු සහ පොදු අභිවෘද්ධිය අරභයා** මෙහෙයවීම සහ සම්බන්ධීකරණය පිණිස යෝග්‍ය වන සැළසුම් සහ පාලනය නීතියෙන් නියම කිරීමෙන් සීඝ්‍ර ලෙස මුළු රට සංවර්ධනය කිරීම,

(v) **පොදු යහපත උපරිම වශයෙන් ඉටුකරනු වස් පොදුජන යහපතට ඉවහල් වන පරිදි ප්‍රජාවගේ භෞතික සම්පත් සහ සමාජ ඵලය සියළු පුරුවැසියන් අතර, සාධාරණ ලෙස බෙදා හැරීම.**

(vi) **නිෂ්පාදනයේ, බෙදාහැරීමේ සහ හුවමාරු කිරීමේ මාර්ග රජයෙහි රාජ්‍ය ආයතනයන්හි හෝ වරප්‍රසාද ලත් අතලොස්සක් අතෙහි හෝ ඒකරාශි නොවී සහ මධ්‍යගත නොවී ශ්‍රී ලංකාවේ සකල ජනතාව අතර විසිරී යන ධර්මිෂ්ඨ සමාජ ක්‍රමයක් පිහිටුවීම,**

(vii) **ජනතාවගේ සදාචාරයෙහිත්**, සංස්කෘතියෙහිත් **තත්ත්වය වැඩිදියුණු කිරීම** සහ පෞරුෂත්වයෙහි පූර්ණ වර්ධනය තහවුරු කිරීම,

(ඇ) **රාජ්‍යය මගින් ආර්ථික සහ සමාජයීය වරප්‍රසාද හා අසමානත්වයද** මිනිසකු විසින් හෝ රජය විසින් මිනිසා සූරාකෑමද **තුරන් කළයුතු බවට නියම කරනු ලැබ ඇත.**

(ඈ) **ආර්ථික ක්‍රියාවලිය ක්‍රියාත්මක වීමෙන් ධනය ඒකරාශිවීම ප්‍රතිඵලය නොවිය යුතු බවටද නිෂ්පාදනය කාර්ය පොදු ජනතාවගේ අගතියට හේතු නොවිය යුතු** බවටද රාජ්‍යය විසින් සහතික විය යුතු බවට නියම කරනු ලැබ ඇත.

(ඉ) **සමාජයීය ආරක්ෂාව සහ අභිවෘද්ධිය** රාජ්‍යය විසින් සහතික කළ යුතු බවට නියම කරනු ලැබ ඇත.

(ඊ) **ජාත්‍යන්තර නීති සහ ජාතීන් අතර කටයුතු කිරීමේදී සන්ධාන පිළිබඳ වගකීම් රාජ්‍යය විසින් ගරු කළ යුතු බව සහ පෝෂණය කළ යුතු බවට නියම කරනු ලැබ ඇත.**

11. (අ) මෙම ඉල්ලීමේ විෂය කාරණය වන එම කෙටුම්පත් පනත ආරම්භ කිරීමේදී සහ/හෝ සකස් කිරීමේදී සහ/හෝ සිදු කිරීමේදී සහ/හෝ එහි ගමන් මාර්ගය ඉටුකර තිබීමේදී 1 සිට 13 දක්වා වූ වගඋත්තරකරුවන් කෙළින්ම සහ/හෝ අන්‍යාකාරයෙන් විධිංගු වී ඇත.

(ආ) 14 සිට 18 දක්වා වූ වගඋත්තරකරුවන් වූ කලී මෙහි විෂය කාරණය වන කෙටුම්පත් පනතේ උපලේඛණයෙහි සඳහන් වන සියළුම ව්‍යවස්ථාපිත පනත්වල ඇති විධි විධාන බලාත්මක කිරීමෙහි ලා ව්‍යවස්ථාමය වශයෙන් බලය පැවරී සිටින තැනැත්තෝ වෙති. 19වන වගඋත්තරකරු, මෙම ඉල්ලීමේ විෂය කාරණය වන කෙටුම්පත් පනතේ උපලේඛණගත කර ඇති විනිමය පාලන පනතේ විධි විධාන බලාත්මක කිරීමෙහි ලා වගකීම දරණ මහ බැංකුවේ අධිපති මෙන්ම ශ්‍රී ලංකාවේ මුදල් මණ්ඩලයේ සභාපතිවරයාද වේ.

(ඇ) අල්ලස් හෝ දූෂණ පිලිබඳ චෝදනා විභාග කර බැලීම සඳහා වූ කොමිෂමේ සභාපතිවරයා වන 20වන වගඋත්තරකරු මෙම ඉල්ලීමට වගඋත්තරකරුවකු කරනු ලැබ ඇත්තේ මෙහි අතුළත් කරනු ලබන ඇතැම් කරුණු වලින් අල්ලස් පනතේ "දූෂණ" යන්නෙහි අර්ථය තුලට එම ක්‍රියා කලාපය සහ ක්‍රියා ගැනෙන බැවින් වන අතර, ඒ පිලිබඳව ඔබතුමන්ලාගේ ගරු අධිකරණය විසින් අධිකරණමය නොතිසි ලබා මෙහි අයැද ඇති ප්‍රකාර ක්‍රියා කරන ලෙස 20වන වගඋත්තරකරුට නියෝග කිරීම උදෙසාය.

(ඈ) 21වන වගඋත්තරකරු වූ කලී ගරු නීතිපතිවරයා වන අතර, ඔහු මෙහි අන්තර්ගත කරනු ලැබ ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77වන වගන්තිය යටතේ වූ ඔහුගේ කර්තව්‍ය සම්බන්ධයෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 134 වන වගන්තිය ප්‍රකාරව සහ 1990 ශ්‍රේෂ්ඨාධිකරණ රීති මාලාවේ 44 (1)(ආ) රීතිය ප්‍රකාරව යන කරුණු දෙකම සම්බන්ධයෙනි.

12. පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කර සිටී:-

(අ) 2003ක්වූ මාර්තු මැද හරියේදී හෝ ඊට ආසන්න කාලයකදී, පාර්ලිමේන්තුවේ දී "දේශිය ආදායම් (විශේෂ විධිවිධාන)" පනත නමැති අභිධානයෙන් යුත් කෙටුම්පත් පනතක් සම්මත වී තිබෙන බව මාධ්‍යය මගින් පෙත්සම්කරුට දැනගන්නට ලැබුණි. කෙටුම්පත් පනත සම්මත කිරීමේ ක්‍රියා මාර්ගය **මධ්‍යයෙහි පළකරනු ලබන තෙක් ඒ** කෙටුම්පත් පනතේ අන්තර්ගතයන් පෙත්සම්කරුට දැනගන්නට නොලැබුණු අතර ඒවා එලෙස දැන ගැනීම සඳහා සාධාරණ සහ/හෝ ප්‍රමාණවත් ක්‍රියා මාර්ගයක් ඔහුට නොතිබුණි.

(ආ) ඉහත කී කරුණ ගැන දැනගන්නට ලැබීමෙන් පසු කෙටුම්පත් පනතේ රජයේ ප්‍රකාශණ කාර්යාංශයෙන් ලබා ගැනීමට පෙත්සම්කරු උත්සහ කළ නමුත් එය විකුණා අවසන් බව ඔහුට දන්වා සිටින ලදී.

(ඇ) ඉන් අනතුරුව, කෙටුම්පත් පනතේ පුස්තකාල පිටපතේ ජායාරූප පිටපතක් රජයේ ප්‍රකාශණ අංශයෙන් පෙත්සම්කරුට ලබාගත හැකි වූයේ 2003.04.03 වන දිනදී වූ මෑත කාලයකදී ය. කෙටුම්පනතේ මතුපිටින් පෙනෙන ආකාරයට එය 2වන **වගඋත්තරකරු වන මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ 2003.01.31 වන දින දීය.**

(ඈ) විමසීමෙන් පසු පෙත්සම්කරුට දැනගන්නට ලැබුනේ ඉහත කී කෙටුම්පත් පනතේ පිටපත් විකිණීම සඳහා රජයේ ප්‍රකාශණ අංශයට ලැබී තිබෙන්නේ 2003.02.11 වන දින දී පමණක් බවය. (එනම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් දින 11ට පසුය) එසේ ලැබී ඇත්තේද සිංහළ පිටපත් 10ක් දෙමළ පිටපත් 5ක් හා ඉංග්‍රිසි පිටපත් 15ක් පමණකි.

(ඉ) මේ අතරතුරදී, ඊට ගැසට් නිවේදන අංකයක් නොමැත්තා වූද, සාමාන්‍ය ගැසට් නිවේදනයක අකෘතියක් නොවන්නා වූද " ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජන රජයේ ගැසට් පත්‍රයක් ලෙස ප්‍රසිද්ධ කිරීමට යෙදුණු " දේශීය ආදායම් (විශේෂ විධි විධාන) " නමැති අභිධානයෙන් යුත් ලේඛණයක පිටපතක් පෙත්සම්කරු විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එක්තරා . . . . ..ලබාගැනීමට යෙදුණි.

(ඊ) ඉහත කී අභිධානයෙන් යුතු කෙටුම්පත් පනතේ අන්තර්ගත පෙත්සම්කරු විසින් ලබා ගන්නා ලද ඉහත කී ලේඛනයට **"කෙටුම්පත් පනතේ කාරක සභා අවස්ථාවේදී යෝජනා කරනු ලබන සංශෝධන ඇතුලත් වූද** <u>නීති කෙටුම්පත් සම්පාදකවරයාගෙන් ලැබුණේ යයි කියනු ලබන</u> " පිටු දෙකක ෆැක්ස් පණිවුඩයක්ද අමුණා තිබුණි.

(උ) අනතුරුව, 2003.03.25 වන දින හෝ ඊට ආසන්න දිනකදී, 2003 අංක. 10 ලෙස **අනිත් අංක යෙදූවා වූද** එහෙත් පනතේ මුද්‍රිත පිටපතක් නොවන්නා වූද, " දේශීය ආදායම් (විශේෂ විධි විධාන) පනත" යයි කියනු ලබන මුද්‍රිත ලේඛණයක පිටපතක් ලබා ගැනීමට පෙත්සම්කරුට හැකිවිය.

(ඌ) පනතේ පිටපතක් යයි කියනු ලබන ඉහත කී ලේඛණයේ 11වන වගන්තිය ප්‍රකාරව <u>**2002ක්වූ ජුනි 05 වන දින සහතික කරන ලද**</u> 2002 අංක. 7 දරණ දේශීය ආදායම් (විශේෂ විධි විධාන) පනත ඉවත් කිරීමට අපේක්ෂා කර ඇත.

(අංකයක් නොයෙදූ) සඳහන් කර ඇති පරිදි වූ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) කෙටුම්පත් පනත අන්තර්ගත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය යන අභිධානයෙන් යුත් එකී ලේඛණය **"A1"** යනුවෙන්ද,

කෙටුම්පත් පනතේ කාරක සභා අවස්ථාවේදී යෝජනා කිරීමට නියමිත සංශෝධන ඇතුලත් පිටපතක් 2කේ ෆැක්ස් පණිවුඩය **"A2"** යනුවෙන්ද,

දේශීය ආදායම් (විශේෂ විධි විධාන) කෙටුම්පත් පනතේ එකී ජායාරූප පිටපත **"A3"** යනුවෙන්ද,

2003 අංක. 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධි විධාන) පනතේ අනිත් අංකය යෙදීමට යෙදුනු මුද්‍රිත පිටපතේ පිටපත **"A4"** යනුවෙන්ද,

2002.06.05 වන දින සහතිකය යෙදීමට යෙදුණු 2002 අංක. 7 දරණ දේශීය ආදායම් (විශේෂ විධි විධාන) පනතේ පිටපත **"A5"** යනුවෙන්ද,

ලකුණු කොට මේ සමඟ අමුණන අතර, ඒවා මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.

13. පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කර සිටී :-

(අ) පාර්ලිමේන්තුවේ සභාගත කරනු පිණිස වූ කෙටුම්පත් පනත් ද ඇතුළුව, ඒවා එලෙස සභාගත කිරීමට කලින් අමාත්‍යවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල ලියකියවිලි පළමු අවස්ථාවේදී ප්‍රතිපත්ති සංවර්ධන සහ ක්‍රියාත්මක කිරීම පිලිබඳ අමාත්‍යංශය මගින් අනුමත කිරීම පිණිස ඊට යොමු කරන බව පෙත්සමකරුට දැන ගන්නට ලැබී තිබේ.

(ආ) ඒ අනුව කෙටුම්පත් පනත (A3) 4වන වගඋත්තරකරු ප්‍රතිපත්ති සංවර්ධන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයා විසින් සහ 5වන වගඋත්තරකරු වූ ආර්ථික

ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ ඉහත කී අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින්ද පරීක්ෂා කර බැලීම පිණිස, ප්‍රතිඵත්ති සංවර්ධන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට යෙදුනේ යයි පෙත්සම්කරු තදින් විශ්වාස කරයි. තවද, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර එය පිරික්සීම පිණිස 5වන වගඋත්තරකරු වන ලේකම්වරයා සහ 6වන වගඋත්තරකරු වන උපදේශකවරයා වෙතද, අනුමත කිරීම සඳහා 1වන වගඋත්තරකාර අග්‍රාමාත්‍යවරයා වෙතද ඉදිරිපත් කරන ලද්දේ යයි විශ්වාස කෙරේ.

(ඈ) එහි සඳහන් කර ඇති පරිදි කෙටුම්පත් පනත (A3) 2වන වගඋත්තරකරු වන මුදල් අමාත්‍යවරයා විසින්, ප්‍රසිද්ධ කරන ලෙස නියෝග කරනු ලැබ ඇති හෙයින් 5වන වගඋත්තරකාර ලේකම් විසින් පරීක්ෂා කර බලා ප්‍රසිද්ධ කිරීම සඳහා යැවිය හැකිව තිබුණි. එසේම 3වන වගඋත්තරකරු වන නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා විසින්ද, ඊට මැදිහත් විය හැකිව තිබුණු අතර, 2වන වගඋත්තරකරු වන මුදල් අමාත්‍යවරයා එහි අන්තර්ගත කරුණු හොඳ හැටි දැනගෙන තිබී ඇත.

(ඇ) 2වන වගඋත්තරකරු වන මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් එම කෙටුම්පත් පනත පාර්ලිමේන්තුවේ මේසය මත තැබීම කර ඇත්තේ, 3වන වගඋත්තරකරු වන නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා විසින් බව පෙත්සම්කරුට දැනගන්නට ලැබී තිබේ.

14. උපදෙස් ලැබී ඇති පරිදි, පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කරයි :-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව පරිදි, කිසියම් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කිරීමෙන් පසු සතියක් තුළදී ඒ කෙටුම්පත් පනතේ විධි විධානවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලත්වය සහ/හෝ වලංගුභාවය සම්බන්ධයෙන් තීරණ කරන ලෙස ඔබතුමන්ලාගේ ගරු අධිකරණයේ අධිකරණ බලය පාවිච්චි කරන ලෙස අයැද සිටීමට ඕනෑම පුරවැසියෙකුට හිමිකම ඇත.

(ආ) ඉහත සඳහන් කරන ලද ආකාරයට කෙටුම්පත් පනත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් **සතියක් තුළදී** කෙටුම්පත් පනතේ (A3) කිසිදු පිටපතක් ජනතාවගෙන් කිසිවකුට ලබා ගැනීමට කටයුතු යොදා නොතිබුණි.

(ඇ) කෙටුම්පත් පනතේ (A3) විධි විධානවලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් උද්දීපනය කර ඇති සමානත්වයේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කෙරෙන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථාවෙන් උද්දීපනය කර ඇති ජනතාවගේ අධිකරණ බලයද උල්ලංඝණය කෙරේ. එයින් **ජනතාවගේ පරමාධිපත්‍යය අතහැර දැමීමක් සිදුවන අතර, එබැවින් එය පාර්ලිමේන්තුව විසින් වලංගු ලෙස සම්මත කළ නොහැකිව තිබුණි.**

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු එහි 3වන ව්‍යවස්ථාවට අනනුකූල වන විධි විධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවේ විධි විධාන යටතේ **අවශ්‍ය කරන විශේෂ බහුතර ඡන්දයෙන් අනුමත කළ යුතු අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ Xiii වන පරිච්ඡේදයේ නියමයන් අනුව ජනමත විචාරණයකදී ජනතාව විසින්ද අනුමත කළ යුතුය.**

(ඉ) කෙටුම්පත් පනතේ (A3) විධි විධානවලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන විශේෂයෙන්ම, සමාව දීමට ජනාධිපතිවරයාට ඇති අනන්‍ය අයිතියට අදාළ විධි විධාන කෙළින්ම සහ/හෝ අන්‍යාකාර ලෙසින් වක්‍ර ලෙස/අගති පිළිවෙලින් අත්හිටවීමක් සිදුවී ඇත. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75වන ව්‍යවස්ථාවෙන් එවැනි කෙටුම්පත් පනතක් සම්මත කර ගැනීමෙන් පාර්ලිමේන්තුවට බාධක කරනු ලැබ තිබේ.**

(ර) කෙටුම්පත් පනතේ (A3) විධි විධාන වලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් ආණ්ඩුවේ එක් අංශයකට එනම් විධායක ජනාධිපතිවරයාට ආරෝපණය කර ඇති බලය වෙනත් අංශයකට එනම්, පාර්ලිමේන්තුවට වක්‍ර ලෙස/අගති පිළිවෙලින් පවරා දෙනු ලැබේ. එය වූ කලී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 3වන ව්‍යවස්ථාවේ නියමයන් අනුව, **මූලික අයිතිවාසිකම්ද ඇතුළු, ජනතාවගේ පරමාධිපත්‍යය අන්සතු කිරීමකි.**

15. 2002.10.15 වන දින හෝ ඊට ආසන්න දිනකදී ඔබ උතුමන්ලාගේ ගරු අධිකරණයේ විනිසුරුතුමන්ලා 7 දෙනෙකුගෙන් සැදුම්ලත් අධිකරණයක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 19වන සංශෝධනය යන අභිධානයෙන් යුතු කෙටුම්පත් පනත සම්බන්ධයෙන් කරන ලද නිශ්චයෙහි,

(i) වෙනත් දේ අතර පහත දැක්වෙන නිගමනවලට එළඹෙන ලදී :-

"(5) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආණ්ඩුවේ එක් අංශයකට ආරෝපනය කර ඇති බලය වෙනත් අංශයකට පැවරීම, හෝ ඒ බලය අත්හැරීම හෝ ඉන් ඉවත් කිරීම වූ කලී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 3වන ව්‍යවස්ථාවට අනුකූල වූ පරමාධිපත්‍යය අන්සතු කිරීමක් වනු ඇත.**"

(ii) වෙන නිගමනයන් අතර සඳහන් කරන ලද නිගමන වල සාරාංශය මෙසේය :-

(1) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75වන ව්‍යවස්ථාවේ අන්තර්ගත නිශ්චිත බාධකය නිසා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් ක්‍රියාත්මක වීම අත්හිටුවීමේ බලපෑම ඇති කිසිවක් පාර්ලිමේන්තුව විසින් වලංගු ලෙස පැනවිය නොහැකිය.**

(2) **4වන ව්‍යවස්ථාවේ අදාළ විධි විධාන සමඟ කියවිය යුතු 3වන ව්‍යවස්ථාවට අනනුකූල විධි විධාන 84(2) ව්‍යවස්ථාවේ විධි විධාන යටතේ අවශ්‍ය කරන විශේෂ බහුතරයෙන් සම්මත කළ යුතු අතර, තත් කාර්ය සඳහා පවත්වන ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කළ යුතුය.**

(iii) ඉහත කී නියෝගයේ නියමය අනුව යමින් ඔබ උතුමන්ලාගේ ගරු අධිකරණය විසින් මෙසේ සඳහන් කර සිටින ලදී.

"**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට සහ අනුගමනය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතර වන උපලේඛණයේ නියමයන් අනුව කර ඇති ගාම්භිරතා පූර්වක ප්‍රකාශයට අනුව අපට මෙම විධිවිධානය බලාත්මක කළ යුතුව ඇත.**"

16. උපදෙස් ලැබී ඇති පරිදි පෙත්සම්කරු තවදුරටත් මෙසේ ප්‍රකාශ කර සිටී :-

(අ) මෙහි මින් ඉහත වැඩිමනක්ම දක්වා ඇති පරිදි, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ විධානාත්මක මූලධර්ම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27වන ව්‍යවස්ථාවෙන් උද්දීපනය **කර ඇති මූලික අයිතිවාසිකම් කෙටුම්පත් පනතේ (A3) විධි විධානවලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව <u>ආරක්ෂා කිරීමට සහ අනුගමනය කිරීමට</u> වගඋත්තරකරුවන් විසින් දී ඇති ගාම්භිරතා පූර්වක දිවුරුම්/ප්‍රතිඥාව කඩකරමින් උල්ලංඝණය වේ.**

(ආ) කෙටුම්පත් පනතේ (A3) වගන්ති වල ප්‍රතිඵලය වන්නේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ විධානාත්මක මූලධර්ම සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් **පොදු ජනතාවට අහිත කරවන ලෙස වරප්‍රසාදලත් ටික දෙනෙකු අතරෙහි ධනය ඒකරාශි වීමය. එය**

**රාජ්‍යයේ අරමුණු වලට විශේෂයෙන්ම ජනතාවගේ සදාචාරාත්මක ප්‍රමිතිය නැංවීමට ප්‍රතිවිරුද්ධය.**

(ඇ) ඉහත කී පරිදි නීත්‍යානුකූල නොවන ලෙස **සම්මත** කරගෙන ඇති කෙටුම්පත් පනතේ (A3) විධි විධාන ආණ්ඩුව විසින් කළ යුතු මනා රාජ්‍ය **පාලනය අත්හැර දැමීමක් වන අතර,** එයින් නීතිය කඩන්නන්ට සහ අපරාධවලට පෙළඹෙන තැනැත්තන්ට පැහැදිලිවම දිරි දීමක් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27වන ව්‍යවස්ථාවෙන්, ජනතාවගේ සදාචාරාත්මක ප්‍රමිතීන් වර්ධනය කරමින් සාධාරණ සමාජ ක්‍රමයක් සහිතව ධර්මිෂ්ඨ සහ නිවහල් සමාජයක් ඇති කිරීම සඳහා ලංකාවෙහි රාජ්‍යානුශාසනයෙහි යෙදිය යුතු ලෙස විධි විධාන සලසා ඇති නමුත් රාජ්‍යානුශාසනය පිළිබඳ සියළු මිනුම්දඩු අතුගා දැමීම සිදුවේ.

(ඈ) කෙටුම්පත් පනතේ (A3) විධිවිධාන තර්කානුකූල නොවන අත්තනෝමතික වන අතර ඒවායින්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූජනීය මූලික මූලධර්මය වන "නීත්‍යානුකූල පාලනය " දරුණු ලෙස උල්ලංඝණය කිරීමක් සහ හීන කිරීමක් සිදුවේ.

17. පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කරයි :-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන උල්ලංඝණය කරමින් කෙටුම්පත් පනත (A3) ආරම්භ කිරීමෙහි ලා සහ/හෝ කෙටුම්පත් කිරීමෙහිලා සහ/හෝ නීති විරෝධීව පැනවීම සිදුකිරීමෙහි ලා සහභාගි වූ තැනැත්තන් වන වගඋත්තරකරුවෝ **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට සහ අනුගමනය කිරීමට එකී දිවුරුම/ ප්‍රතිඥාව මගින් බැඳී සිටින අතර, එසේ කිරීම මගින් ඔවුන්ගේ එම <u>දිවුරුම/ප්‍රතිඥාව කඩකෙරෙන ආකාරයෙන් ක්‍රියා කර ඇත.</u>**

(ආ) කෙටුම්පත් පනත (A3) ගැන කටයුතු කිරීමේදී ඔවුනොවුන්ගේ ව්‍යවස්ථාපිත කාර්යවල සහ වගකීම්වල ප්‍රමාණය දක්වන්නට යෙදුනු 1 සිට 19 දක්වා ලැයිස්තු ගත කර ඇති තැනැත්තන් අතුරින් ඇතැම් රාජ්‍ය නිලධාරීන් සහ 21වන වගඋත්තරකරුද කෙටුම් පත් පනත (A3) නීතියට අනුකූල නොවන ලෙස පැනවීමට යෙදී ඇති බව <u>සහමුලින්ම දැනගෙන නොසිටිය</u> බව පෙත්සම්කරු තදින්ම විශ්වාස කරයි. මහ බැංකුවේ අධිපතිවරයා සහ ශ්‍රී ලංකා මුදල් මණ්ඩලයේ සභාපතිවරයාද වන 19වන වගඋත්තරකරු මේ ගැන නොදැන සිට බව පෙත්සම්කරු තවදුරටත් දැඩි ලෙස විශ්වාස කරයි.

18. පෙත්සම්කරු මෙසේ පවසා සිටී:-

(අ) 7වන වගඋත්තරකාර අමාත්‍යවරයාට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ අමාත්‍යවරයා ලෙස කෙටුම්පත් පනතින් <u>(A3)</u> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය නොවන ආකාරයට ඉදිරිපත් කිරීමට සහ එය ඊට අනුකූල වන බවට වග බලා ගැනීමෙහි ලා වැඩි <u>වගකීමක් තිබේ.</u>

(ආ) 9වන වගඋත්තරකරු ටද, අධිකරණ අමාත්‍යවරයා වශයෙන් කෙටුම්පත් පනතින් (A3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය නොවන ආකාරයට ඉදිරිපත් කිරීමට සහ එය ඊට අනුකූල වන බවට වගබලා ගැනීමෙහිලා <u>වැඩි වගකීමක්</u> තිබේ.

19. උපදෙස් ලැබී ඇති පරිදි, පෙත්සම්කරු ගෞරවයෙන් මෙසේ සඳහන් කර සිටී:

(අ) " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 19වන සංශෝධනය " යන අභිධානයෙන් යුත් කෙටුම්පත් පනත සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ගරු අධිකරණයේ විනිසුරුවන් 7 දෙනෙකුගේ අධිකරණය විසින් ඒකමතිකව තීරණය කොට 2002.10.15 වන දින 11වන වගඋත්තරකරු වන කථානායකවරයාට දක්වා සිටියේ ඒ කෙටුම්පත් පනතේ ඇතැම් විධිවිධාන පාර්ලිමේන්තුව විසින් වලංගු ආකාරයෙන් සම්මත කරනු නොලැබිය හැකි බවය. එමඟින් ස්ථිර කර සිටිනු ලැබුවේ නීති පැනවීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට ලබා දී ඇති බලය, ඒ

සඳහා බලය පාර්ලිමේන්තුවට ලබා දී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්ම අවස්ථානුකූලව පාලනය කර ඇති බවය.

(ආ) මේ අයුරින් සහ අන්‍යාකාර ලෙසද කෙටුම්පත් පනත (A3) නියම කර ඇති කරුණු ඉටු කිරීම මත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇති කාර්යය පටිපාටිය අනුව යමින් යථා පරිදි සහ නීතියට අනුකූල ලෙස සම්මත කර නැත.

20. උපදෙස් ලැබී ඇති පරිදි පෙත්සම්කරු මෙසේ කියා සිටී:

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ආරක්ෂා කිරීමට සහ අනුගමනය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 63වන ව්‍යවස්ථාවේ නියමයන් යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් නිල දිවුරුමක්/ප්‍රතිඥාවක් කර තිබෙන නිසා, ඉහත කී පරිදි කෙටුම්පත් පනතක් නීති විරෝධීව නීතිය බවට පැනවීම පිණිස එය අනිත්‍යානුකූලව පැනවීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන කඩකරමින් ක්‍රියා කිරීම පිණිස ඔවුනට බලතල නැත.

(ආ) කෙසේ වෙතත්, තමන් කෙරෙහිම සහ/හෝ වරප්‍රසාදලත් කීප දෙනෙකු වෙත ප්‍රතිලාභයක් පවරා ගනිමින්ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27වන හා 28වන ව්‍යවස්ථා මගින් උද්දීපනය කර ඇති විධි විධාන උල්ලංඝණය කරමින් අති විශාල මුදල් සම්භාරයක් රජයට අහිමි කරමින් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට සහ අනුගමනය කිරීමට දී ඇති ඔවුන්ගේ ගාම්භිරතා පූර්වක දිවුරුම/ප්‍රතිඥාව කඩකරමින්ද, කෙටුම්පත් පනත (A3) නීත්‍යානුකූලව සම්මත කර ගැනීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ආබාධිත බලතල නොතිබේ. තවද, එසේම නොතිබිණි.

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික මූලධර්මයන් සහ ආරක්ෂිත විධිවිධානයන් උල්ලංඝණය කරමින් (A3) පනත් කෙටුම්පත ඉහත කී පරිදි නීති විරෝධීව පැනවීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාවේ උද්දීපනය වී ඇති මහජනයාගේ ව්‍යවස්ථාදායක බලය අනිසි සහ අයුතු ලෙස පාවිච්චි කිරීමකට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාවේ උද්දීපනය වී ඇති අන්සතු කළ නොහැකි වන්නාවූ මහජනයාගේ ස්වාධිපත්‍යයද අන්සතු කිරීමක්ද වන්නේය.

(ඈ) ආණ්ඩුබලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මහජනයා සතුකර ඇති අතර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් භාරකරුවන් වශයෙන්, මහජනයා වෙනුවෙන් භාරකාරයෙන් යුතුව, මහජනයාගේ ව්‍යවස්ථාපිත බලය ක්‍රියාවේ යෙදවීමට බැඳී ඇත.

(ඉ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන සංශෝධනය යන ශිර්ෂ පාඨයෙන් යුතුව වූ පනත් කෙටුම්පත පිලබඳව ඔබතුමන්ලාගේ අධිකරණයේ හත් සාමාජික විනිසුරු මඩුල්ලකගේ ඒකමතික නිශ්චයෙහි, වෙනත් නිගමනයන් අතර මෙසේද නිගමනය කරන ලදී.

**" ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත මොනයම් හෝ කාර්යාංශයකට බන්ධන විරහිත කිසිදු හෝ අභිමතයක් හෝ බලයක් පවරා නොමැත"**

(ඊ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන සංශෝධනය යන ශිර්ෂ පාඨයෙන් යුතුව වූ පනත් කෙටුම්පත පිලබඳව ඔබතුමන්ලාගේ අධිකරණයේ හත් සාමාජික විනිසුරු මඩුල්ලකගේ ඒකමතික නිශ්චයෙහි, වෙනත් නිගමනයන් අතර මෙසේද නිගමනය කරන ලදී.

**" වෙනත් කාර්යාංශයකට අදාලව යම් කාර්යාංශයකට පවරනු ලැබ ඇති පරීක්ෂා කිරීමකට සංස්ථාපනය වන බලය සියළු කල්හිම ක්‍රියාවේ යෙදවිය යුතු වන්නේත්, මහජනයාට භාරකාරත්වයෙන් යුතුවය. මෙය නව සංකල්පයක් නොවන්නේය. පොදු නීතියේ මූලික පදනම වන්නේ බලය භාරයේ දැරීම පවත්වාගෙන යාමය "**

21. පෙත්සම්කරු මෙසේද ප්‍රකාශ කර සිටී.

(අ) **මහජනයාට ඔවුන්ගේ භාරකරුවන් වශයෙන් භාරකාරත්වයෙන්** යුතුව පාර්ලිමේන්තු

මන්ත්‍රීවරුන් විසින් ක්‍රියාවෙහි යෙදවීමට බැඳී සිටින්නාවූ මහජනයාගේ ව්‍යවස්ථාදායක බලය ඉක්මවා ඉහත කී ආකාරයට ක්‍රියා කරමින් නීති විරෝධී ලෙස පනවනු ලැබූ පනත් කෙටුම්පතක් මොනයම් ආකාරයකින් වත් නීත්‍යානුකූල නොවන්නේය.

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ භාරකාරත්වයට පවරනු ලැබ ඇති මහජන ව්‍යවස්ථාදායක බලය, ප්‍රචලිතව ඇත්තාවූ සමාජ යුක්ති ධර්මයේ සහ සදාචාරයේ සියළුම මූලධර්මයන්ට එරෙහිව ක්‍රියා කරමින් රටට වංචාවක් පමුණුවීමට හෝ නීත්‍යානුකූලව මහජනයාට අයිතිවන්නාවූ සම්පත් අතිවිශාල ප්‍රමාණයක අර්ථලාභාදි, වරප්‍රසාද ලත් අතලොස්සකගේ ප්‍රතිලාභය සඳහා ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීම දැරීමට, අයුතු සහ/හෝ අනිසි ලෙස පාවිච්චි කළ හැක.

22. පෙත්සම්කරු මෙසේද කියා සිටී.

(අ) ජාතියටත් ජාතික උන්නතියටත් නියතින්ම සිදුවන්නාවූ බරපතල ප්‍රතිවිපාක නොතකමින් මහජන විජිතයෙහි මොනයම් ආකාරයක හෝ සාකච්ඡාවකින් සහ/හෝ විවාදයකින් තොරව ඉහත කී පරිද (A3) පනතේ කෙටුම්පත ලහිලහියේ නීති විරෝධී ලෙස සම්මත කරගනු ලැබ ඇත.

(ආ) 2වන වගඋත්තරකාර මුදල් අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුවට 2003.01.31 දින ඉදිරිපත් කරනු ලැබ ඇති බව එහි දක්වනු ලැබ ඇත්තේ වී නමුත්, රජයේ ප්‍රකාශණ කාර්යාංශය වෙත 2003.02.11 දින <u>එනම්, එසේ ඉදිරිපත් කර සිටිනු ලැබීමෙන් දින 11කට පසු</u>- ලැබෙන්නට සලස්වනු ලැබ ඇත්තේ එකී (A3) පනත් කෙටුම්පතේ සීමිත පිටපත් සංඛ්‍යාවක් පමණක් වනවා සේම, එම (A3) පනත් කෙටුම්පත පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුලත් කරනු ලැබ ඇති බව පෙත්සම්කරු පොදු මහජනයාගේ සාමාජිකයකු වශයෙන් ඒ පිලිබඳ නොදැන සිට අතර, ඒ ගැන දැනුවත් වීමට අවකාශයක් ඔහුට නොමැති වූ බැවිනුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 ව්‍යවස්ථාව සමඟ කියවෙන 121 ව්‍යවස්ථාව යටතේ සහ එහි නියමයන් ප්‍රකාර ඔබ උතුමානන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය පතා සිටීමේ ව්‍යවස්ථානුකූල අයිතිය (සැබවින්ම මහජනයාට මෙන්ම) පෙත්සම්කරුට අහිමි කරනු ලැබ ඇත.

(ඇ) පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි තැබූ කල්හි, දේශපාලනමය කාරණයක් සහ ප්‍රශ්ණයන් පිලිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත කී ව්‍යවස්ථාවන් යටතේ ඔබ උතුමානන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය නිත්‍ය වශයෙන් පතා සිටිනු ලබන බව දේශපාලනඥයින් හොඳාකාරවම දැන සිටිති ("ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 19වන සංශෝධන " ශීර්ෂ පාඨනයෙන්වූ පනත් කෙටුම්පතට එරෙහිව, පෙත්සම් 24ක් ගොනු කෙරුණි). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කරමින් සහ මහජනයාට අතිමහත් පාඩුවක් සිදුකිරීම සලස්වමින් මහජනයාගේ පරමාධිපත්‍ය සහ අයිතිවාසිකම් අන්සතු කිරීමට එමගින් තැත් කිරීමක් වූ තාක් දුරට, මහජනයාගේ යහපත සහ උන්නතිය උදෙසා ව්‍යවස්ථානුකූල අයිතියක් ලෙස වන කාරණයක් වශයෙන්, හොඳ හෘදසාක්ෂියකින් යුතුව එම පනත් කෙටුම්පත පොදු මහජනයාගේ දැන ගැනීමට සැලැස්විය යුතුව තිබුණි.

(ඈ) A3 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බව පෙත්සම්කරුට වහාම දැනගන්නට ලැබුනේ නම්, පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමෙන් පසු නියම කරනු ලැබ ඇති දින 07ක් ඇතුළත, ඒ පිලිබඳව ඔබ උතුමානන්ලාගේ නිශ්චයයක් අයදිමින් පෙත්සම්කරු විසින් ඔබ උතුමානන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය පතා සිටිනු ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාර ඔබ උතුමානන්ලා විසින් මහජනයාගේ අධිකරණ බලය ක්‍රියාවේ යොදවනු ලබන බැවින්,

(ඉ) එවැනි පනත් කෙටුම්පතක් කෙරෙහි ඔහුගේ/ඇයගේ අප්‍රසාදය . . . එහි වලංගු භාවය සහ ව්‍යවස්ථානුකූලභාවය ඔබ උතුමානන්ලාගේ අධිකරණය අභියස අභියෝගයට ලක් කිරීමේ ඔහුගේ/ඇයගේ මූලික අයිතිවාසිකම ක්‍රියාවේ යෙදවීමේ අවස්ථාවක් පෙත්සම්කරු ද ඇතුළුව පොදු මහජනයාගේ මොනයම් හෝ . . ..අවස්ථාවක් සැලසෙන සේ (A3) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිලිබඳව මහජනයාට ප්‍රමාණවත් දැනුම්දීමක් කරලීම සහතික

කර සිටීම, 1 සිට 19 සහ 21 වගඋත්තරකරුවන්ගේ විධායක සහ පරිපාලනමය කාර්යභාරය විය.

(ඊ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව මගින් නියම කරනු ලැබ ඇති කාලසීමාව ඇතුළත, ඔබ උතුමානන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය පතා සිටීමෙන් පෙත්සම්කරු වලක්වා . . . ඉහත කී වගඋත්තරකරුවන්ගේ කල් ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කෙරෙන සමානාත්මක තාවයට පෙත්සම්කරුට වන අයිතියත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(4) ව්‍යවස්ථාව මගින් සහතික කෙරෙන අදහස් ප්‍රකාශ කිරීමේ මූලික පෙත්සම්කරුගේ අයිතිවාසිකමද අහිමිකර උල්ලංඝනය කරනු ලැබ ඇත.

(උ) 1 සිට 19 සහ 21 වගඋත්තරකරුවන්ගේ සිදුකරන ලද්දා වූ සහ සිදුනොකරන ලද්දාවූ ක්‍රියාවන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14 (1)(4) ව්‍යවස්ථාවන්හි ගැබ් කරනු ලැබූ පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇත්තාවූ විධායක හෝ පරිපාලනමය ක්‍රියාවන්වලට සංස්ථාපනවන්නන් වේ.

(ඌ) පෙන්නුම් කරනු ලැබ ඇති අවස්ථානුගත හේතු තත්ත්වයන් අනුව, මහජන යහපත සහ උන්නතිය සඳහා ක්‍රියා කරමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 ව්‍යවස්ථාවේ යටතේ සහ එහි නියමයන් ප්‍රකාර, ඔහුගේ කාර්ය භාරයන් හා බැඳීයාවට ඉටු කිරීමේ අවස්ථාව පෙත්සම්කරුට අහිමි කිරීම අයුක්ති සහගත සහ අසාධාරණ වේ.

23. පෙත්සම්කරු මෙසේ කියා සිටී:-

(අ) මෙහි පහත අයැද සිටිනු ලැබ ඇති නොයෙකුත් සහනයන් ප්‍රදානය කරනු ලැබීමටආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාර ඔබ උතුමානන්ගේ අධිකරණය වෙත පවරනු ලැබ ඇති අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීමේ බලය චුතකරනු ලැබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 124 ව්‍යවස්ථාවේ විධිවිධානයන් මගින් නොකරන අතර, එසේ කිරීමට නොහැකිය. වඩාත් විශේෂයෙන්ම (A3) පනත් කෙටුම්පත ජාතියට සහ මහජනයාට අහිතකර මෙන්ම අලාභ සිදුකරනු ලබන බැවින් මහජන උන්නතියට හානිකර වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පදනම සහ මූලික මූලධර්මය වන "නීතියේ මහිමය" සෝදා පාළු වන නිසාත්ය.

(ආ) " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 18වන සංශෝධනය " යන අභිධානයෙන් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඔබ උතුමන්ලාගේ අධිකරණයේ හත් සාමාජික විනිසුරු මඩුල්ල විසින් කරන්නට යෙදුනු ඒකමතික නිශ්චයයෙහි වෙනත් දේ අතර, පහත සඳහන් අයුරු නිශ්චය කර තිබුණි.

**" මින් පෙරාතුව ව්‍යාතිරේකයකින් තොරව, විධායක සහ පරිපාලනමය ක්‍රියා කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාවේ ගැබ් කරනු ලැබ ඇති අධිකරණ බලයට යටත් කරනු ලැබ ඇත "**

24. (අ) මෙහි අඩංගු සම්ප්‍රකාශයන්හි සම්බන්ධය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩකෙරෙන හෝ නීත්‍යානුකූලව සම්මත කළ නොහැකි යම් විධි විධානයන් එහි තිබුනේදැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 ව්‍යවස්ථාව මගින් විධානය කරනු ලැබ ඇති පරිද්දෙන් (A3) පනත් කෙටුම්පත 21වන වගඋත්තරකාර ගරු නීතිපතිවරයා විසින් පරීක්ෂා කර නොමැති හෝ පරීක්ෂාකිරීමට ඔහුට අවස්ථාවක් නොවුන බවත්, ආනුෂංගිකව ඒ පිලිබඳ ඔහු විසින් මත ප්‍රකාශයක් දී හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධානය කර ඇති පරිදි ජනාධිපතිනියට ඔහුගේ මත ප්‍රකාශය දැනුම් දීමක් හෝ කර නොමැති බවත්, එවැනි මත ප්‍රකාශයක් ජනාධිපතිනිය විසින් නොලද බවත්, පෙත්සම්කරු තරයේ විශ්වාස කරනු ලබන බවත්,

(ආ) එලෙසින්ම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සුදානම් කර තිබූ අවස්ථාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 ව්‍යවස්ථාව මගින් විධානය කරනු ලැබ ඇති පරිදි

(A3) පනත් කෙටුම්පතට කර තිබූ (A2) සංශෝධනයන්ද 21වන වගඋත්තරකාර ගරු නීතිපතිවරයා විසින් පරීක්ෂා කර බලා, ඒ පිළිබඳ ඔහුගේ මත ප්‍රකාශය 11වන වගඋත්තරකාර කථානායක වෙත දැනුම් දී නොමැති බවත්, එවැනි මත ප්‍රකාශයක් කථානායකට ලැබී නොමැති බවත්, පෙත්සම්කරු තරයේ විශ්වාස කරන බවත්,

(ඇ) 11වන වගඋත්තරකාර කථානායකවරයා බරපතල ලෙස රෝගාතුරව, වෛද්‍ය ප්‍රතිකාර සඳහා විදේශගතව සිට දිවයිනට ආපසු පැමිණියේ 2003.03.16 ඉරු දින ආසන්නයේ පමණක් පනත් කෙටුම්පත් සම්මත කරනු ලැබ ඇති ලෙසට සහතික කිරීමට 2003.03.17වන සඳුදා වන අතර ඔහුගේ අත්සන් ලබාගෙන ඇත්තේ, ඔහුගේ අසනීපයෙන් ඔහු පූර්ණ සුවයක් නොලැබ සිටි, මෙහි පෙන්නුම් කර දී ඇති පටහැනිතාවයක්/අක්‍රමිකතාවයන්/නීතිවිරෝධීතාවයන් පිළිබඳව (A3) පනත් කෙටුම්පතේ වලංගුතාවය පරීක්ෂා කර බැලීමට අවස්ථාවක් ඔහුට නොවුන මොහොතක බව පෙත්සම්කරුට දැනගන්නට ලැබී තිබේ.

25. (අ) (A3) පනත් කෙටුම්පතේ පූර්විකාවේ මෙසේ දක්වනු ලැබ ඇත.

"2002 මාර්තු 31 දින පෙරාතුව ආදායම් සහ වත්කම් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් නොකළ පුද්ගලයින්ට, ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීම කර සිටීමට අවකාශය සැලසීමට ප්‍රකාශ කළවුන්ට සහ නොකළවුන්ට යම් අනුග්‍රහයන් ප්‍රදානය කරලීමට සලසා දීමට එවැනි පුද්ගලයින් විසින් මතු කල්හිදී පවත්නා බදු නීතින් ඉටුකිරීම සුරක්ෂිත කරලීමේ අභිලාශයෙන් යම් යම් බදු ගෙවීමෙන් සහ නියම කරනු විමර්ශනයන් ගෙන් නඩු පැවරීම්වලින් සහ දණ්ඩනයන්ගෙන් එවැනි පුද්ගලයින් හානිපූර්ණය කරලීමටත්, 2002 අංක. 7 දරණ ආදායම් බදු (විශේෂ විධිවිධාන) පනත් අවලංගු කිරීම සැලැස්වීමට සහ එයට සම්බන්ධිත හෝ ප්‍රාසංගික කාරණයන් සැලැස්වීමටත් "

(ආ) එය ආදායම් බදු සඳහා රාජ්‍ය සමාදීම සඳහා වන බවට එහි මුණතින් පෙන්නුම් කළද, (A5) "ආදායම් බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත යන නොමඟ යවන සුළු සහ/හෝ මුළාකරන සුළු ශිර්ෂ පාඨයේ මුවාවෙන් නීති විරෝධී ක්‍රියාවන් වරදක් සිදුකිරීම් සහ/හෝ සමාජයට එරෙහි අපරාධයන් සම්බන්ධයෙන් වන වෙන නොයෙකුත් ව්‍යවස්ථාවන්ද එම පනත් කෙටුම්පතේ අන්තර්ගත කරනු ලැබ ඇත "

(ඇ) එය ආදායම් බදු පිළිබඳව වු කාරණාපන් පමණක් සම්බන්ධයෙන් වන්නක් බවට වු ව්‍යාජ ප්‍රබන්ධයෙන් යුතුව සහ ආදායම් බදු (විශේෂ විධි විධාන) පනත යනුවෙන් වු විලාශයෙන් (A3) පනත් කෙටුම්පතට ජාතික සහ පොදුජන යහපත සඳහා පනවා තිබූ පහත සඳහන් ව්‍යවස්ථාවනහි විධි විධානයන් උල්ලංඝණය කිරීමද අන්තර්ගත කරනු ලැබ ඇත.

i. **රේගු ආඥාපනත (235 පරිච්ඡේදය)**

ii. **සුරාබදු ආඥාපනත (52පරිච්ඡේදය)**

iii. **සුරාබදු (විශේෂ විධිවිධාන) පනත**

iv. **1969 අංක. 1 දරණ ආනයන සහ අපනයන පාලන කිරීමේ පනත,**

v. **විදේශ විනිමය පනත (423 පරිච්ඡේදය)**

(ඈ) (A3) පනත් කෙටුම්පතේ පූර්වකාමි දක්වනු ලැබ ඇති ප්‍රකාර බදු සහ දණ්ඩනයන් පමණක් නොව ඉහත කී ව්‍යවස්ථාවන් තීරු බදු සහ/හෝ දණ්ඩනයන් සහ/හෝ දඩ සහ සිරගත කිරීමේ දණ්ඩන නියමයන්ද සලසා තිබේ.

**(ඉ) ඒ අනුව, ඉහත කී පූර්විකාව, එහි විධිවිධානයන්හි නියම බලපෑම, විෂය සීමාව සහ බලසීමාව පිළිබඳව වෙස් ගැන්වීමක් සහ මුළාකිරීමක් කරනු ලැබ ඇත.**

26. සමාජ ප්‍රජාව විසින් පිළිගනු ලැබ ඇති පරිදි වන පොදු ප්‍රතිපත්තියට සහ ජාතික අරමුණුවලට අනුකූලව කටයුතු කිරීම සලස්වනු ලැබ ඇති වෙනත් වරදක් අතර, පහත සඳහන් වරද සිදුකිරීම් ඉහත කී ව්‍යවස්ථා අණ පනත්වලට ඇතුළත්ය.

i. මත්ද්‍රව්‍ය, . . ,ගිනි අවි සහ ආරක්ෂක සංවේදී උපකරණ වැනි සීමාකළ/තහනම් කළ දේවල් චෞර්යානික කිරීම්ද ඇතුළුව, චෞර්යානික කිරීම්,

ii. වෙනත් දේ අතර නීති විරෝධී/කූට නිපැයුම් සහ/හෝ වෙළඳ පොළේ හොර ජාවාරම් වලක්වාලමින් පාරිභෝගිකයන්ගේ යහපත ආරක්ෂා කිරීමට පනවන ලද බුද්ධිමය දේපල පනතේ විධි විධානයන් උල්ලංඝණය කිරීම,

iii. කසිප්පු ආදිය වැනි නීති විරෝධී මත්පැන් පෙරීම සහ විකිණීම,

iv. පොදු යහපත වෙනුවෙන් තහනම් කරනු ලැබ ඇති ද්‍රව්‍යයන් ආනයනය සහ/හෝ අපනයන කිරීම,

v. ජාතික ආර්ථිකයට හානිදායි විදෙස් විනිමය පාලනය උල්ලංඝණය කිරීම,

vi. ශ්‍රී ලංකාව විසින් ඇතුළත්ව ඇති ජාත්‍යන්තර සම්මුතීන්/ගිවිසුම් යටතේ තහංචි කෙරුණු, . . .මත්ද්‍රව්‍ය ජාවාරම් සහ ත්‍රස්තවාදය වැනි කටයුතු වලට සම්බන්ධිත හොර සල්ලි ජාවාරම්,

(ආ) ඉහත සඳහන් වරද සිදුකිරීම් සමහරක් මහේස්ත්‍රාත්වරයකුට ඇප දීමට පවා, බලයක් නොමැති දණ්ඩ නීති සංග්‍රහයේ විධි විධානයන් යටතේ දඩුවම් කළ හැකි අපරාධ නීති සංග්‍රහය යටතේ උපලේඛණගත වරදක් වන බැවින්, ආදායම් බදු රාජ්‍ය සමාවක් යන මුවාව සහ රැවටිල්ල යටතේ නඩු පැවරීමෙන්, දඬුවම් කිරීමෙන් සහ සිරගත කිරීමෙන් කිසිසේවත් මොනයම් හෝ පරිහාරයක් හෝ සමාවක් දිය නොහැකිය.

27. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහ එහි නියමයන් ප්‍රකාර ශ්‍රී ලංකාවේ ජනාධිපති විසින් තනිකරවම පමණක් ක්‍රියාවේ යෙදවිය යුතු මහජනයාගේ විධායක බලය (A3) පනත් කෙටුම්පත මගින් වක්‍රව සහ උපක්‍රමශිලීව පැහැරගනු ලැබ ඇති අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාව සමඟ කියවූ විට අන්සතු කළ නොහැකි මහජනයාගේ ස්වාධිපත්‍යය එයින් අන්සතු කෙරෙයි.

(ආ) (A3) පනත් කෙටුම්පත නීති විරෝධී, ව්‍යවස්ථාවිරෝධී වන අතර, එය පාර්ලිමේන්තුවේ <u>නීත්‍යානුකූලව පැනවිය නොහැක්කකි.</u>

(ඇ) " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 19වන සංශෝධනය " යන ශිර්ෂ පාඨයෙන් වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඔබ උතුමන්ලාගේ අධිකරණයේ විනිසුරු 07 දෙනෙකුගෙන් යුතු විනිසුරු මඩුල්ලක් විසින් ඒකමතිකව වෙනත් දේ අතර, මෙසේ තීරණය කරනු ලැබුණි.

**" ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආණ්ඩුවේ එක් කාර්යංශයකට ආරෝපනය කරනු ලැබූ යම් බලයක් ආණ්ඩුවේ අන් අංශයකට මාරු කිරීමක් කිරීම හෝ අතහැරීමක් හෝ රජයේ එම කාර්යාංශයෙන් ඉවත් කිරීමක් කළ නොහැකි වන අතර, මොනයම් හෝ එවැනි මාරුකිරීමක් අත්හැරීමක් හෝ ඉවත් කිරීමක්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව සමඟ කියවෙන, 3වන ව්‍යවස්ථාවට ප්‍රතිවිරුද්ධ වන්නා වූ පරමාධිපත්‍යය අන්සතු කිරීමක් වන්නේය "**

(ඈ) " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 19වන සංශෝධනය " යන අභිධානයෙන් වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඔබ උතුමන්ලාගේ අධිකරණයේ විනිසුරු 07 දෙනෙකුගෙන් යුතු විනිසුරු මඩුල්ලක් විසින් ඒකමතිකව වෙනත් දේ අතර, මෙසේ තීරණය කරනු ලැබුණි.

මෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපනය කිරීමෙහිලා යෙදෙන්නාවූ මුඛ්‍ය රීතියක් ප්‍රත්‍යක්ෂ කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මොනයම් හෝ ප්‍රතිපාදනයක ව්‍යංජිත සංශෝධනයක් විය නොහැක".

(ඉ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් සඳහා වන පනත් ලෙසින් පනත් කෙටුම්පතේ දිගු නාම පාඨයෙහි ප්‍රකාශිතවම සහ නියත වශයෙන් විස්තර කරනු ලැබුවහොත් මිස,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මොනයම් හෝ ව්‍යවස්ථාවක් සංශෝධන කිරීමට/අවලංගු කිරීමට/වෙනස් කිරීමට මොනයම් හෝ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82(1) ව්‍යවස්ථාව ප්‍රකාශිතවම තහනම් කරයි.

28. (අ) ඉහත කී පනත් කෙටුම්පතේ 6 (4) වගන්තියේ මෙසේ නියම කරනු ලැබ ඇත.

**" 4 1994 අංක 19 දරණ අල්ලස් සහ දූෂණ පිළිබඳ දෝෂාරෝපන විමර්ශනය කිරීමේ කොමිෂන් සභා පනත් යටතේ පමුණුවනු ලැබූ යම් නීති කෘතියක් සම්බන්ධයෙන් හැරුණු විට ප්‍රකාශකයෙකුගේ අනන්‍යතාවය හෝ 2වන වගන්තිය යටතේ කරන ලද මොනයම් හෝ ප්‍රකාශයක අඩංගු මොනයම් හෝ තොරතුරක් එළිදරව් කර සිටීමට 1වන උප වගන්තියේ සඳහන් මොනයම් පුද්ගලයකු ගෙන් හෝ ඉල්ලා සිටීමට කිසියම් නීති අධිකරණයකට කළ නොහැක"**

(ආ) ඒ අනුව සහ එමගින්, ඉහත කී පරිදි සමාජයට එරෙහිව සාපරාධී ක්‍රියාවන්හි යෙදුණු වරදකරුවන්ට එරෙහිව විමර්ශණ සහ නඩු පැවරීම ඉදිරියට ගෙන යාමට නීති අධිකරණයන්ට සහ නීත්‍ය බලාත්මක කරන බලධාරින්ට මෙය අවහිර වනු ඇත. " ඉන්ටර්පෝල්" වැනි ජාතික විමර්ශණ අධිකාරීන් විසින් විමර්ශණ කිරීමට අවකාශයදී ඇති, ශ්‍රී ලංකාව පාර්ශවයක් වන ජාත්‍යන්තර සම්මුති සහ ගිවිසුම් කඩකිරීමකටද මෙය තුඩුදේ.

(ඇ) රජයට සහ එමගින් මහජනතාවටද හිමිවන්නාවූ නීත්‍යානුකූල ආදායම් අහිමි කරලමින්, දූෂිත පුද්ගලයින් විසින් රජයට එරෙහිව දැන දැනම සහ හිතාමතාම පමුණුවන ලද විශාල වංචා පිළිබඳව ඉහත කී ව්‍යවස්ථාපිත අධිකාරීන් සහ නීතිය බලාත්මක කිරීමේ රජයේ අනිකුත් නියෝජිත කණ්ඩායම් වල රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ ජීවිත පවා පරදුවට තබා දිග වසර ගණනාවක් තිස්සේ පැවැත්වූ විමර්ශණයන් සඳහා වූ ඔවුන්ගේ දුෂ්කරදායි උත්සහයන්ද (A3) පනත් කෙටුම්පත සැහැල්ලුවට ලක් කරයි.

(ඈ) ඔවුනට ව්‍යවස්ථාපිතව විධානය වී ඇති පරිදි, සමාජයට එරෙහිව වූ අපරාධයන් සහ රජයට සිදුකළ පාඩු මැඩලීමට මතු ක්‍රියා කටයුතු කිරීමෙන්, " නීතියේ මහිමයට" සහ මනා පාලනයේ මූලධර්මයන්ට පටහැනිව, ඔවුන් අධෛර්යමත් කරලමින් ඉහත කී ව්‍යවස්ථාපිත අධිකාරීන්ගේ සහ අදාළ නීති බලාත්මක කිරීමේ බලධාරීන් (A3)පනත් කෙටුම්පතේ විධි විධානයන් මගින් දුබල කිරීමක් සිදුකරනු ඇත.

(ඉ) වංචා හා දූෂණ තර්ජනයද ඇතුළුව අපරාධ ක්‍රියා ගැන කටයුතු කරනු පිණිස නීතිය බලාත්මක කරනවා පමණක් නොව නව නීති දිගින් දිගටම පනවනු ලබන ලෝකයෙහි වෙන කිසිදු ශිෂ්ඨ සම්පන්න රටක, මෙවැනි දුරදිග යන සහ පුළුල් රාජ්‍ය සමාදීම් ප්‍රදානය කිරීම් පෙත්සම්කරු නොදනී.

29\. (අ) ප්‍රභවය ගැන තැකීමකින් තොරව ඒ සඳහා, බදු රාජ්‍ය සමාවදීමක් කරනු පිණිස 14වන වගඋත්තරකාර දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට මුදල් සහ/හෝ චංචල සහ හෝ නිශ්චල වත්කම් එළිදරව් සහ/හෝ ප්‍රකාශ කිරීම (A3) පනත් කෙටුම්පත සලස්වා ඇති අතර

(ආ) මුදල් පිලිබඳ ප්‍රකාශයන් එම මුදල් දරණ තැනැත්තා විසින් හෝ ඔහුගේම නමින් හෝ වෙනත් ඕනෑම නමකින් හෝ මොනයම් හෝ නමක් නොමැතිව කළ හැකි බව විශේෂයෙන් එහි 7 වගන්තියෙහි වැඩිදුරටත් නියම කරනු ලැබ ඇත.

(ඇ) A3 පනත් කෙටුම්පතේ 3වන වගන්තියේ නියමයන් ප්‍රකාර හුදෙක්ම එවැනි එළිදරව්වක් සහ/හෝ ප්‍රකාශයක් මත,

(I) 15වන වගඋත්තරකාර රේගු අධ්‍යක්ෂ ජනරාල්,

(II) 16වන වගඋත්තරකාර සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්,

(III) 17වන වගඋත්තරකාර විනිමය පාලක,

(IV) 18වන වගඋත්තරකාර ආනයනය සහ අපනයන පාලක, යන අයවළුන්ගේ විෂය පථය සහ/හෝ අධ්‍යක්ෂණය යටතේ එන්නා වූ පනත් කෙටුම්පතේ උපලේඛණ ගත කරනු ලැබ ඇති අනිකුත් ව්‍යවස්ථාපිත නීතින් යටතේ බදු සහ/හෝ දඩ ගෙවීම, සහ/හෝ දණ්ඩනයන් සහ/හෝ නඩු පැවරීම් වලින් පූර්ණ නිදහසක් සාවද්‍ය සහ/හෝ නීති විරෝධී ලෙස ප්‍රදානය කිරීමට . . ..සිටී.

(ඈ) කෙසේ වෙතත්, එම අනිකුත් ව්‍යවස්ථාපිත නීතින් යටතේ සහ/හෝ ඒවා යටතේ අධිකරණයන් විසින් නියම කරනු ලබන දඩ මුදල් අවලංගු කිරීමට එම (A3) පනත් කෙටුම්පත විධි විධාන සලසා නොමැති අතර එසේ කළ නොහැක.

(ඉ) බදු සමාව සඳහා 14වන වගඋත්තරකාර ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාට පුද්ගලයකු විසින් ප්‍රකාශ කරනු ලබන අගය සහ මුදල්/වත්කම්වල ප්‍රමාණය සහ අනුරූප ගනුදෙනු සහ/හෝ අනිකුත් ව්‍යවස්ථාපිත නීතින් යටතේ පමුණුවා ඇති අපරාධ සහ ඒවායේ අගයන් අතර බැඳීම සහ/හෝ සම සම්බන්ධතාවය (A3) පනත් කෙටුම්පතේ නියම කර නොමැත. (උදාහරණයක් වශයෙන් බදු සමාව සඳහා රුපියල් මිලියන එකක ප්‍රකාශය සහ රුපියල් මිලියන 400ක දඩ මුදලක් ඇද ගැනෙන වෙනස් රේගු උල්ලංඝනයන් සහ/හෝ විනිමය පාලන උල්ලංඝණයන් දහයක් අතර බැඳීම)

(ඊ) (A3) පනත් කෙටුම්පතේ උපලේඛණයේ අඩංගු,

(i) 1981 අංක 69 දරණ පිරිවැටුම් බදු පනත,

(II) 1991 අංක. 52 දරණ ජාතික ආරක්ෂක අය බදු පනත,

(III) 1996 අංක 34 දරණ බඩු සහ සේවා පනත යටතේ පුද්ගලයින් විසින් එකතු කළ මුදල්, ඒ පරිද්දෙන්ම ආදායම් මත වන බදු නොවේ, ඒවා පාරිභෝගික ජනයාගෙන් එවැනි පුද්ගලයින් විසින් රාජ්‍ය ඒජන්තවරු වශයෙන් එකතු කරනු ලැබූ මුදල්ය. එබැවින්, එම මුදල් හරියාකාරව සහ නීත්‍යානුකූලව රජයට අයත්වන අතර, එම මුදල් සඳහා කිසිදු හිමිකමක් නොමැති වන්නාවූ පුද්ගලයින්ට, එම මුදල් රඳවා ගෙන සිටීමට නීති විරෝධී ලෙස ඉඩ හැරිය නොහැක.

මෙම අනියම් බදු රජයට ගෙවනු පිණිස නිසියාකාරව පාරිභෝගික ජනයා විසින් ගෙවනු ලැබ ඇත. රාජ්‍ය සමාව නිසා එම මුදල් දැන් රජයට ගෙවිය යුතු

නොවුනත්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය . . .ප්‍රදානය කිරීමට අදහස් කරනු ලැබ ඇති පුද්ගලයින්ට, එම මුදල් ඔවුන් ළඟම රඳවාගෙන සිටීමට අයිතියක් නොමැත.

30. (අ) (A3) පනත් කෙටුම්පත යටතේ අදහස් කර ඇති රාජ්‍ය සමාවන් ප්‍රදානය කරනු ලැබුවහොත් ජාතික ආර්ථික මහා පරිමානයක් සැලකිය යුතු ආදායමක් රජයට අහිමිවනු ඇති බව පෙත්සම්කරු තරයේ විශ්වාස කරයි.

(ආ) එකී ආදායමින් සමහරක් අධිකරණයන් අභියස පවත්නා නඩු වලින් එකතු වන්නාවූ දඩ මුදල් සහ සාර්ථක ලෙසින්ම කළ නඩු වලින් එකතු වන දඩ මුදල් විය හැක. එවැනි නීත්‍යානුකූල ආදායම් රජයට සහ මහජනයාට වංචා කිරීමට මොනයම් හෝ යුක්ති සහගත හේතු සාධකයක් හෝ න්‍යායාක් නොමැත.

(ඇ) රජයට ඉහත කී පරිදි අහිමි වන්නාවූ ආදායම් ප්‍රමාණයක් ගණන් ගෙන අගය කළ හැකි වන්නේ, ඔබ උතුමානන්ලාගේ අධිකරණය වෙත එම තොරතුරු ගෙනහැර දැක්විය යුතු ලෙසට නියම කළ යුතු 14,15,16,17 සහ 18 වගඋත්තරකරුවන්ට පමණි.

(ඈ) ලැබිය යුතු වන්නාවූ ඉහත කී මුදල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ ව්‍යවස්ථාවන්හි ගැබ් කරනු ලැබ ඇති පරිදි ඒකාබද්ධ අරමුදලේ අරමුදල් වන අතර, ඒනිසා ඒ සඳහා හිමිකමක් සහ සැලකිල්ලක් ඇත්තාවූ, පෙත්සම්කරුද ඇතුළුව මෙරටෙහි සෑම පුරවැසියෙකුට එම මුදල් අයත් වේ.

(ඉ) A3පනත් කෙටුම්පත ප්‍රමාණවත් මහජන එළිදරව්වකින් සහ විවාදයකින් තොරව කඩිමුඩියේ නීති විරෝධී ලෙස සම්මත කරගෙන තිබෙනවා පමණක් නොව අදාල ආදායම් සහ වියදම් ඇස්තමේන්තු අයවැය ප්‍රතිපාදනයන්හි එළිදරව් කර සිටින ලෙසින් 2වන වගඋත්තරකාර මුදල් ඇමති විසින් එසේ කළ යුතුව තිබුනේ නමුත්, A3 පනත් කෙටුම්පත සම්මත කරගනු ලැබීමෙන් රජයට සිදුවන්නාවූ ආදායම් පාඩුව ඇස්තමේන්තු කළ සහ ගණන් බැලූ ගණන් හිලව් ඔහු පෙන්නුම් කර සිටීමටද ඔහු අපොහොසත් වී ඇත.

(ඊ) A3 පනත් කෙටුම්පත මගින් දැන් අහිමි වන්නා වූ සහ දැනටමත් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඇත්තාවූ 2004 අයවැයට ඇතුලත් කර ඇත්තාවූ ඉහත කී ආදායමට ඉහත කී අදාල ව්‍යවස්ථාපිත අධිකාරිය විසින් එකතු කිරීමට ගණන් බලා අපේක්ෂා කළ ආදායම් මාර්ගයන්ද ඇතුළත් වේ.

(උ) 2003 වසරට එසේ අඩුකම් ඇතිවන්නා වූ එසේ ගණන බැලුන ආදායම් මාර්ගයක් පුරවාලන්නේ කෙසේද සහ කුමන මාර්ගයකින්ද යන්න පැහැදිලි ලෙස පෙන්වීමට 2වන වගඋත්තරකාර මුදල් ඇමතිවරයා අපොහොසත් වී ඇත.

(ඌ) අනියම් බදු වලින් 24% ක බදු ආදායමක් 2002 වසරේදී එකතු කිරීමට රජය අපේක්ෂා කළ බව පෙත්සම්කරුට දැනගන්නට ලැබී තිබේ. පෙත්සම්කරුට දැන ගන්නට ලැබී ඇති පරිද්දෙන් නියම ආදායම, අපේක්ෂිත ආදායමෙන් රුපියල් මිලියන 20,000 ක අඩුවකින් යුතුව වී ඇත. මේ තත්ත්වය අනුව, A3 පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන්, වරප්‍රසාදලත් නීති කඩකරන්නන් අතලොස්සක් සාවද්‍ය සහ නීති විරෝධී ලෙස සමෘද්ධිමත් කරමින්, රජයට අති විශාල ආදායම් ප්‍රමාණයක් අහිමි කරලීම ඇත්තෙන්ම පොදු ජන යහපත සඳහා විය නොහැක.

(එ) රජයට සිදුවන්නාවූ අති විශාල ආදායම් පාඩු වලට අමතරව හොරබඩු ජාවාරම්, මිල වට්ටෝරුවල අඩු ගණන සටහන් කිරීම, ආයෝජන මණ්ඩලයේ නිපැයුම් ස්වදේශීය වෙළඳ පොලට බැහැර කිරීම වැනි ක්‍රියාවන් වලින් ස්වදේශීය කර්මාන්ත වලට අනිසි සහ අසාධාරණ තරඟයක් ඇති කරමින් ඒවාට පාඩු සිදුකිරීමෙන් වසා දැම්මමට සිදුවීමේ හේතුවෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27වන ව්‍යවස්ථාවේ ගැබ්වූ රාජ්‍ය ප්‍රතිශක්ති සහ මූලික කාර්ය භාරයන් සහ අරමුණුවල නියමිත මූලධර්මයන් උල්ලංඝණය කරමින්, රැකියා අවකාශයන් නැතිකරනු ලැබේ.

31. (අ) ඉහත කී අතිවිශාල හෘදසාක්ෂි විරෝධී ගජවාසි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්

උල්ලංඝණය කරමින් ඉහත කී පරිදි පහසුවෙන්ම <u>ගෙවීමට හැකියාව ඇත්තාවූ සහ නීතියෙන් ගෙවීමට බලකළ යුතු වන්නාවූ</u> වරප්‍රසාද ලත් අතලොස්සකට ප්‍රදාන කිරීමට තැත් කරනු ලැබේ.

(ආ) <u>ඇප මුදල් සහ/හෝ සුළු දඩ මුදල් නොගෙවීමේ හේතුවෙන් අගී භාවයෙන් පෙළෙන්නාවූ පුද්ගලයන් බොහෝ දෙනෙකු සිරබත් කති</u>. මොවුන් ඇප මුදල් සහ/හෝ සුළු දඩමුදල් ගෙවීමට හැකියාවක් නොමැති අය වන අතර, ඒ අනුව මොවුන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැබ්ව ඇති සමානාත්මක සැලකීම අහිමිකරනු ලැබ ඇත.

(ඇ) සේවා අර්ථ සාධක අරමුදල් සහ සේවා අර්ථසාධක භාර අරමුදල් වැනි ව්‍යවස්ථාපිත ගෙවීම් පැහැර හරිනු ලබන ඇහලුම් අපනයනකරුවන් " අපනයන කෝටා " ප්‍රදානය නොකරනු ලබන බව 7වන වගඋත්තරකර අමාත්‍යවරයා සහ 8වන වගඋත්තරකාර ලේකම් දනිති. මොවුන්ටද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැබ්වූ සමානාත්මක සැලකීම ඒ අනුව අහිමි කරනු ලැබ ඇත.

(ඈ) රටට වටිනා විදෙස් විනිමයක් උපයන ඇහලුම් අපනයනකරුවන්ට ඇහලුම් " අපනයන කෝටා " ප්‍රදානය කිරීම සඳහා බලාත්මක කරනු ලබන එවැනි නියමයන් ගැන අභියස රජයට අයවිය යුතු නීත්‍යානුකූල ගෙවීම පැහැර හැරීම රජය වංචා සිදුකරන බදු පැහැර හරින්නන්ට, හොර ජාවාරම්කරුවන්ට සහ විනිමය පාලනය උල්ලංඝණය කරනවුන්ට රජයේ පුද්ගලිකකරණ වැඩසටහන්වල සහභාගිවීමට සහ රජය එනම් මහජනයාට හර්යාකාරව හා නීත්‍යානුකූලව අයත්වන්නාවූ මුදල් වලින් ගෙවීම් කරමින් රාජ්‍ය දේපල මිළදී ගැනීමට ඉඩ හැරීම අසාධාරණය.

(ඉ) 1වන වගඋත්තරකාර අග්‍රාමාත්‍යවරයා 2002ක්වූ ජුලි මස පමණ ජාතිය අමතමින්, රටෙහි එක් එක් හා සෑම පුරවැසියකුගේම ප්‍රති ශීර්ෂණය මට්ටමද ඇතුළුව, ඒ පිලිබඳ සිද්ධාන්ත සහ විස්තර ගෙන හැර දක්වමින්, ශ්‍රී ලංකාව මුහුණ පා ඇති අගාධිත සහ බරපතල ආර්ථික අසීරුතාවය සහ රටෙහි ණයගැති භාවය බලවත්යයි පිළිඹිබු කලේය.

(ඊ) 1වන වගඋත්තරකාර අගමැතිවරයා ජාතිය අමතා කළ කථාවේ සම්බන්ධතාවය අනුව ප්‍රතිශීර්ෂණය මට්ටම ඉහළ යමින් ඉහත කී පරිදි බරපතල ලෙස ණය බරින් පෙළෙන මෙරටෙහි ජනයාට හර්යාකාරව අයිති ආදායම් ඔවුනට අහිමි කරමින් වරප්‍රසාද ලත් නීති කරන්නවුන් අතලොස්සකට රුපියල් බිලියන ගණනාවක ගජවාසි ප්‍රදානය කිරීම සාධාරණත්වය සහ න්‍යාය ධර්මය අදහාගත නොහැක.

(උ) දැන දැනම සහ හිතාමතාම නීතිය කඩකරමින් රජයේත් මහජනතාවගේත් යහපතට එරෙහිව ක්‍රියා කළ වරප්‍රසාද ලත් අතලොස්සකගේ අසාධාරණ සමෘද්ධිය සහ නීති විරෝධී වරප්‍රසාද ප්‍රදානය කරමින් මහජනයාට හර්යාකාරව අයත්වන්නාවූ සම්පත් අහිමිකරමින් ඒවා කොල්ලකෑමට සහ ගසා කෑමට ඉඩ හරමින් මෙවන් සර්වපූර්ණ රාජ්‍ය සමාවත් ධනවත් සහ සංවර්ධිත රටවල් වලටත් ප්‍රදානය කිරීමට නොහැකි හා එවැනි රටවල් වත් ප්‍රදානය නොකරනු ඇති බව පෙත්සම්කරු තරයේ විශ්වාස කරයි.

(ඌ) "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 18වන සංශෝධනය " යන ශීර්ෂ පාඨයෙන් යුතුවූ පනත් කෙටුම්පත පිලිබඳව ඔබ උතුමානන්ලාගේ හත් පුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් වෙනත් නිගමනයන් අතර, මෙසේ නිගමනය කරන ලදී.

"ව්‍යවස්ථාපිත නොවන්නාවූ එවැනි සභාවකට පර්හාරයක් දෙනු ලැබුවහොත් නීතියේ මහිමයට පටහැනි වන්නාවූ නීතියට යටත් නොවන්නාවූ ආයතනයකට එය උසස්වනු ඇත. නීතියේ මහිමයේ " ලුහුඩු තේරුම වන්නේ අත්තනෝතික භාවයේ පැවැත්ම තුරන් කිරීම සහ නීතිය අභියස සමානාත්මකතාවය පැවැත්වීට 4වන ව්‍යවස්ථාවට වන සංශෝධනය ක්‍රියාත්විත වීමේදී වන්නේ ඔවුන්ගේ ක්‍රියාවන් අධිකරණ සමාලෝචනයකට යටත් නොවන අමුතු මිනිස් පංතියක් බිහිකිරීමය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට සහ නීතියේ මහිමයේ මූලධර්මයන්ට පටහැනි වන්නාවූ එවැනි පර්හාරයක් ප්‍රදානය කිරීම යුක්ති සහගත නොවන්නේය.

1වන වගඋත්තරාකර අගමැතිවරයා ජාතිය අමතා කළ කථාවේ කොටස් අඩංගු 2002.07.05 දින දරණ ඩේලි මිරර් පුවත්පතේ පිටුවේ සත්‍ය පිටපතක් "B" යනුවෙන් ලකුණු කොට මෙහිම අන්තර්ගත කොටසක් ලෙසින් මෙයට යා කරනු ලැබ ඇැ

32. (අ) සමාජයීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතින්ට අනදීමටත්, අයවැයට සහය වීමටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා ජාත්‍යන්තර බැංකුව ලෙසින්ද හැඳින්වෙන) ලෝක බැංකුව, මුදල් පාලනය සැලසුම් කිරීමට රජයට සහයවීමේ නිරත වී සිටින අතර ණය මුදල් ආධාර මුදල් ලබා ගැනීමට රජයට සහය දක්වයි.

(ආ) ඉහත කී ආයතනයන් එකී කාර්ය භාරයන් ඉටු කිරීමේදී සහනාධාර කප්පාදු කිරීම, රාජ්‍ය සේවය අඩුකිරීම සහ පුද්ගලිකරණය කඩිනම් කිරීම වැනි කොන්දේසි පනවනු ලබන වා සේම දුගී භාවය තුරන් කිරීමේ වැඩ සටහන් වලට මුදල් උපයනු ලබන බව ප්‍රකටය.

(ඇ) පාන් සහනාධාර සහ පොහොර සහනාධාර වැනි සමහර සහනාධාර අඩු වරප්‍රසාද ලත් සමාජයීය පුළුල් කොටසකට කෙළින්ම බලපාන අතර, සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි සමාජ අංශයන් අත්‍යවශ්‍ය මුදල් හිඟකමින් පෙළෙති.

(ඈ) පෙන්නුම් කර ඇති සිද්ධාන්ත සහ අවස්ථානුගත තත්ත්වයන් අනුව රජයට අහිමිවන්නාවූ ආදායම් සහ/හෝ ඔවුන් විසින් රජයට වංචාකළ මුදල් ගෙවීමට හැකියාවක් ඇත්තාවූ වරප්‍රසාද ලත් වරදකරුවන්ට සහ/හෝ නීතිය කඩ කලවුන අතලොස්සකට ගජවාසි ප්‍රදානය කරමින්, රජයට නීත්‍යානුකූලව ලැබිය යුතු ආදායම මහ පරිමානයක් අහිමිකර පාඩු සිදුකිරීම ඉහත සඳහන් ආයතනයන් විසින් කෙසේ නමා කරන්නේදැයි අදහා ගත නොහැක.

33. (අ) එවකට අධිකරණ ඇමතිවරයා වශයෙන් 7වන වගඋත්තරකරු විසින් 20වන වගඋත්තරකරු දැන් එහි සභාපති වන අල්ලස සහ දූෂණ පිලිබඳ චෝදනා විමර්ශණය කිරීම සඳහා කොමිෂන් සභාව පිහිටුවීමට පාර්ලිමේන්තුව ඉදිරිපත් කළ 1994 අංක. 19 දරණ පනත පැනවීමක් සමගම **<u>අතීතයම බලපෑමක් නොවන්නේ</u>** නම් නමුත්, "දූෂණය" ද අල්ලස පනත යටතේ වරදක් ලෙස ඇතුළත් කරමින් 1999 අංක. 20 දරණ අල්ලස් පනත ඔහු විසින්ම ඉදිරිපත් කළ සංශෝධනය කිරීමේ පනත මගින් අල්ලස් පනත සංශෝධනය කළේය.

(ආ) 1994 අංක.20 දරණ අල්ලස් සංශෝධිත පනත ප්‍රකාර පහත සඳහන් නව වගන්තිය 70වන වගන්තිය වෙනුවට ආදේශ කරමින් "දූෂණය" අර්ථ නිරූපනය කර දැක්වුනි.

මොනයම් පුද්ගලයකුට හෝ රජයට සිදුවෙතැයි හෝ මොනයම් පුද්ගලයකුට සාවද්‍ය හෝ නීති විරෝධී අර්ථලාභයක්,, අනුග්‍රහයක් හෝ වාසියක් ප්‍රදානය කරනු ලැබෙතැයි දැන දැනම යම් රාජ්‍ය සේවකයකු රජයට සාවද්‍ය හෝ නීති විරෝධී පාඩුවක් සිදුකිරීමේ හෝ ඔහු වෙත අන් පුද්ගලයෙකුට සාවද්‍ය හෝ නීති විරෝධී අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් ප්‍රදානය කිරීමේ චේතනාවෙන්ම,

(අ) රාජ්‍ය සේවකයකු වශයෙන් ඔහුගේ නිලයේ බලයෙන් ඔහුට බලය පැවරී ඇති යම් කාර්යයක යෙදීමෙන් වලකින්නේ නම් ,

(ආ) රාජ්‍ය සේවකයකු වශයෙන් ඔහුගේ නිල බලයක් පැවරී ඇති යම් කාර්යයක් ඉටු කිරීමෙන් වැලකී සිටීමට අන් රාජ්‍ය සේවකයකු පොළඹවන්නේ නම්,

(ඇ) රාජ්‍ය සේවකයකු වශයෙන් ඔහුගේ නිලබලයෙන් ඔහුගේ දැන ගැනීම ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන්නේ නම්,

(ඈ) රජයේ සේවකයකු වශයෙන් සිය තනතුරේ බලය පිට කවර හෝ තීරණයක් කිරීම සම්බන්ධයෙන් සහභාගි වීම,

(ඉ) යම් කටයුත්තක් ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළැක්වීම පිණිස, එවැනි රජයේ සේවකයකු වශයෙන් සිය තනතුර පාවිච්චියට ගනිමින්, කෙළින්ම හෝ අනියම්ව හෝ වේවා යම් වෙනත් තැනැත්තකු පෙළඹවීම,

දූෂණය පිලිබඳ වූ වරදට වරදකරු වන්නේය. තවද, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු විභාගයෙන් හා වරදකරු වීමෙන් අනතුරුව, <u>අවුරුදු දහයක් නොඉක්මවන කාලයකට සිර දඬුවමකට</u>

හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එම සිරදඬුවම සහ දඩය යන දෙකටම යටත් වන්නේය".- (අවධාරණය එකතු කරන ලදී)

(ඇ) 1994 අංක. 20 දරණ අල්ලස් (සංශෝධන) පනත අනුව " රජයේ සේවකයකු " සම්බන්ධ අර්ථනිරූපනය, වෙනත් අය අතර කැබිනට් ඇමතිවරයකු, කැබිනට් නොවන ඇමතිවරයකු, කථානායක, නියෝජ්‍ය ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රි රජයේ සේවකයා හෝ සේවා නියුක්තියා ආදී වශයෙන්ද ඇතුළත් වීමට පුළුල් ද කරනු ලැබීය.

(ඈ) අල්ලස් හෝ දූෂණය විමර්ශණයට ස්ථිර කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා සහ එකී නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වශයෙන් දූෂණය ඇතුළත් කිරීම පිණිස වන ඉහත කී පනත් දෙකම පාර්ලිමේන්තුවේ දී ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

(ඉ) 1994 ඔක්තෝම්බර් මාසයේදී, පාර්ලිමේන්තුවේදී ඉහත කී පනත් සම්මත කිරීම සම්බන්ධ විවාදයේ දී, එවකට අධිකරණ ඇමතිවරයා වශයෙන්, 7වැනි වගඋත්තරකරු, වෙනත් දේ අතර, මෙලෙසද ප්‍රකාශ කලේය:-

" ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හා දූෂණය පිලිබඳව අපේ රටේ විශාල අමනාපයක් සහ පිළිකුලක් තිබෙන බව ඔබතුමන් දන්නවා. එමනිසා මහජන මතය අනුව නීති සම්පාදනය කිරීම රජයේ යුතුකම වෙනවා. "

" මූල්‍ය සම්බන්ධය හැරුණු විට, නින්දාශීලි ස්වභාවයේ අහංකාර දැනීමක් පිලිබඳ වූ ප්‍රශ්ණයක් තිබේ. අපේ රටේ දූෂණය හා අල්ලස මුල් බැසගෙන ඇති ප්‍රමාණය ගැන අපේ රටේ ඥාණවන්ත, විචක්ෂණ, සිතන ජනතාව අධික අසතුට පලකර ඇත. නින්දාශීලි ස්වභාවය පිලිබඳ වූ මෙම අධ්‍යාත්මක ගුණයට පිළියම් නොයෙදුවහොත්, අපේ රටේ දේශපාලන හා සාමාජික ආයතනවල ස්ථිරත්වයට හා ශාන්ත භාවයට ඒකාන්ත අනතුරක් තිබේ. ඒ නිසා තමයි, අල්ලස සහ දූෂණය පිලිබඳ වූ ප්‍රශ්ණයට ප්‍රබල පිළිතුරක් තිබිය යුතුය යනුවෙන් රජය විශ්වාසය ඇතිකර ගන්නා ලදී".

(ඊ) 1994 ඔක්තෝම්බර් මාසයේදී, පාර්ලිමේන්තුවේදී ඉහත කී පනත් සම්මත කිරීම සම්බන්ධ විවාදයේදී, එවකට විපක්ෂ නායකයා වශයෙන් 1වැනි වගඋත්තරකාර අගමැතිතුමා, වෙනත් දේ අතර, මෙලෙසද ප්‍රකාශ කලේය:-

"ඇත්තවශයෙන්, අල්ලස සහ දූෂණය පිලිබඳ වූ සමස්ථ ප්‍රශ්ණය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක බොහෝ මූලික ප්‍රශ්ණ මතුකරයි. තෝරා පත්කරගත් නියෝජිතයන් සහ රජයේ සේවකයිනුත් වන රජයේ නිලධාරීන් වන විට, ඔවුන්ගේ තීරණ දේශපාලන සළකා බැලීම පිලිබඳ කරුණු මගින් නොව, එහෙත් මුදල් ඵලප්‍රයෝජන සහ මූල්‍ය වාසි මගින් ක්‍රියාත්මක කරන විට, දූෂණය ප්‍රජාතන්ත්‍රවාදයේ පිළිකාවක්, අප මුහුණ දී සිටින විශාලතම ප්‍රශ්ණ වලින් එකක් වශයෙන් අප සියළු දෙනාම හඳුනාගත යුතුව ඇත. "

(උ) 1වැනි වගඋත්තරකරු සහ 7වැනි වගඋත්තරකරු විසින් පාර්ලිමේන්තුවේදී කරන ලද ඉහත කී ප්‍රකාශ දෙක, අල්ලස සහ දූෂණය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ඉහත කී නීති සම්මත කිරීම සම්බන්ධව ව්‍යවස්ථාදායකගේ අදහස පැහැදිලි ලෙස පෙන්නුම් කරයි.

(ඌ) ඒ අනුව, වරප්‍රසාද ලත් ස්වල්ප දෙනෙකුට වාසි ප්‍රදානය කිරීමේ කපටි අදහස ඇතිව සහ ඒ මගින් රජයට අති විශාල පාඩු සලස්වමින්ද, (ඒ3) ලකුණු කර ඇති පනත් කෙටුම්පත විවාද කිරීම සහ/හෝ එයට මන්ත්‍රිවරුන් කැමති කරවා ගැනීමෙන් සහ/හෝ ක්‍රමවත්ව දැන්වීම සහ/හෝ නීති විරෝධී නීතිගත කිරීමට සැලැස්වීම සම්බන්ධයෙන් උපකාර වූ සහ/හෝ මැදිහත් වූ එම පුද්ගලයින් විසින් වැරදි ලෙස කරනු ලැබූ ක්‍රියාවන්ම, ඉහත කී පරිදි (ඒ3) පනත් කෙටුම්පත සුළු වැඩි ඡන්දයකින් පමණක්, නීති විරෝධී ලෙස සම්මත කරගනු ලැබ ඇති හෙයින්, පාර්ලිමේන්තුව විසින් ඒකමතික නීතිගත කළ ඉහත කී " දූෂණ " විධි විධානය කඩකිරීමක්ය යනුවෙන් පෙත්සම්කරුට උපදෙස් ලැබී ඇත.

හැන්සාඩ් වාර්තාවේ 1994.10.04 දින 280 සිට 288 දක්වා තීරු සහ හැන්සාඩ් වාර්තාවේ 1994.10.05 දින 401 සිට 412 දක්වා තීරු පිළිවෙලින් " සී1" හා " සී2" ලකුණු කර මෙම පෙත්සමට අමුණා ඇති අතර, ඒවා මෙහි අවශ්‍ය කොටස් වශයෙන් දක්වා සිටී.

34. තමා ලෝක බැංකුවේ සභාපති වෙත ඉදිරිපත් කර තිබූ කරුණුවලින් අනතුරුව, ලෝක බැංකුවේ සභාපතිගේ උපදෙස් මත ශ්‍රී ලංකාවේ ලෝක බැංකුවේ මෙරට වැඩ සටහන් සම්බන්ධිකරණ නිලධාරී තැනගෙන් තමන්ට 2002.09.25 දිනැති ලිපිය ලැබුණු බව පෙත්සම්කරු ප්‍රකාශ කරයි. එය මෙසේ ප්‍රකාශ කරයි:-

" ඔබගේ ලිපියේ සටහන් කර තිබූ පරිදි ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය මෙන්ම, එම ආයතනයේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය වංචාව සහ දූෂණය සම්බන්ධ ප්‍රශ්ණ ඉතා බරපතල ලෙස සළකති. එපමණක්ද නොව සංවර්ධනය වන රටවල ප්‍රජාව, ඉතා බරපතල ලෙස සලකති. එපමණක්ද නොව, සංවර්ධනය වන රටවල ප්‍රජාව, මෙම අවුරුද්දේ මොන්ටරේහිදී පැවැත්වූ රැස්වීමේ දී මෙම ප්‍රශ්ණය පිළිගත්තෝය. යම් තැනෙක සංවර්ධන ආධාර තිබිය යුතු නම්, එවිට අප අපගේ රට නිසි පිළිවෙලට තබාගත යුතුය. අපි අපගේ මිනිස් බලය ගොඩනැගීම සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුය. අයිතිවාසිකම් ආරක්ෂා කරන නීති පද්ධතිය සම්බන්ධයෙන් අපි ක්‍රියා කළ යුතුය. විනිවිද භාවය තිබෙන මූල්‍ය පද්ධති අපට තිබිය යුතු අතර, අප දූෂණයට විරුද්ධව සටන් කළ යුතුය"

ලෝක බැංකුවෙන් ලැබුණු 2002.09.25 දිනැති එකී ලිපියේ සත්‍ය පිටපතක් " ඩී" ලකුණු කර මෙම පෙත්සමට අමුණා ඇති අතර, එය මෙහි අවශ්‍ය කොටසක් වශයෙන් දක්වා සිටී.

35. පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කරයි:-

(අ) (ඒ3) පනත් කෙටුම්පතේ විධිවිධානමගින් සමහර පුද්ගලයින් පිට අති විශාල මූල්‍ය ලාභ, අනුග්‍රහ හෝ වාසි ප්‍රදානය කිරීමට වැරදිසහගත ලෙස සහ/හෝ නීති විරෝධී ලෙස අත්සහ ගනු ලබන බව, ඒ මගින් රජයට වැරදිසහගත ලෙස සහ/හෝ නීති විරෝධී ලෙස පාඩු සලස්වන බව බහුල ලෙස පැහැදිලිය. මෙය, ඉහත කී පනතේ අර්ථය ඇතුළත " දූෂණයට " සමාන බව පෙත්සම්කරුට උපදෙස් ලැබී ඇත.

(ආ) වගඋත්තරකරුවන් අතුළුව, තවද, ඔවුන්ගෙන් කවර හෝ කෙනෙකුට සීමා නොවී, ඉහත කී පරිදි, විවාද කල සහ/හෝ මන්ත්‍රිවරුන් කැමති කරවාගත් සහ/හෝ සහභාගි වූ සහ/හෝ (ඒ3) පනත් කෙටුම්පත නීති විරෝධීන නිතිගත කිරීම සඳහා සැළැස්වීමට ක්‍රියාකල ඔවුන්ගෙන් කවර හෝ අයෙකු ඔවුන්ම සඳහා නඩුවලින් රාජ සමාව සහ/හෝ මුක්තිය ලබාගැනීම පිණිස ඉහත කී නීති විරෝධී ලෙස නිතිගත කළ (ඒ3) ලකුණු කර ඇති පනත් කෙටුම්පත යටතෙ සරණ පතයි නම්, ඒ මගින් රජයට වැරදිසහගත ලෙස සහ නීති විරෝධී ලෙස හානි සලස්වමින්, ඔවුන්ටම වැරදිසහගත සහ/හෝ නීති විරෝධී ලාභ, අනුග්‍රහ හෝ වාසි ලබාගනියි නම්, ඔවුන්ද එවිට " දූෂණය " පිළිබඳ වරද සිදුකරනු ලබන්නේය, නඩු පවරනු ලැබීමට යටත් වන්නේ යැයි පෙත්සම්කරුට උපදෙස් ලැබී ඇත.

(ඇ) (ඒ3) පනත් කෙටුම්පතේ 6(4) වගන්තිය යටතේ, පොදු යුක්තිය වෙනුවෙන්, ප්‍රකාශකරුගේ අනන්‍යතාවය හෝ (ඒ3) පනත් කෙටුම්පතේ 2වැනි වගන්තිය යටතේ කරනු ලබන කවර හෝ ප්‍රකාශයක අඩංගු කවර හෝ තොරතුරක් ඉල්ලා සිටීමට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට හිමිකම් ඇති නිසා-

(1) ඉහත කී පරිදි " රජයේ සේවක " යන විග්‍රහයේ අර්ථය ඇතුළතට ගැනෙන කවර හෝ පුද්ගලයින් විසින් කරනු ලබන යම් එවැනි ප්‍රකාශ 14වැනි වගඋත්තරකාර දේශිය ආදායම් කොමසාරිස් ජෙනරාල්, 20වැනි වගඋත්තරකාර, අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවේ සභාපති වෙත දැනුම් දිය යුතුය,

තවද,

(ii) ඉහත කී පරිදි " රජයේ සේවක " යන අර්ථය ඇතුළතට ගැණෙන, කවර හෝ පුද්ගලයකු විසින් කරනු ලබන එවැනි යම් ප්‍රකාශයන් දැනුම් දෙන ලෙසට, 20වැනි වගඋත්තරකාර අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සභාපති 14වැනි වගඋත්තරකාර, දේශිය ආදායම් කොමසාරිස් වරයාට නියම කර සිටිය යුතුය.

36. පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කරයි:-

(අ) 3වැනි වගන්තියේ 3වැනි උපවගන්තිය (ඒ3) පනත් කෙටුම්පතේ අඩංගුව නොතිබුණේය. එහෙත්, එම සංශෝධනයන් අඩංගුව තිබෙන (ඒ2) දරණ ඉහත කී පිටු දෙකේ ෆැක්ස්පතේ එළිදරවු වන පරිදි පනතේ කාරක සභා අවස්ථාවේ ඉදිරිපත් කිරීමට තිබූ සංශෝධන පිළිබඳ වූ ප්‍රකාශයේ අඩංගුව තිබුණි.

(ආ) (ඒ3) පනත් කෙටුම්පතේ අඩංගුව නොතිබුණු 3වැනි වගන්තියේ 3වැනි උපවගන්තිය මෙසේ කියැවෙයි:-

"3. මෙම පනතේ 2වැනි වගන්තිය යටතේ විනිමය පාලන පනතේ (423 පරිච්ඡේදය) අරමුණු සඳහා ප්‍රකාශ කළාවූ යම් වත්කමක් සම්බන්ධයෙන්, 2002ක්වූ මාර්තු 31 වන දින හෝ පසුව සිදුවෙන කවර හෝ ගණුදෙනුවක් ඇත්නම්, එම ගණුදෙනුව 2002 මාර්තු 31 දින හෝ ඊට පෙර සිදුවී ඇති පරිදි, 1වැනි උපවගන්තියේ සඳහන් කර ඇති මුක්තියම ලැබෙන්නේය."

(ඇ) 21වැනි වගඋත්තරකාර ගරු නීතිපති, ව්‍යවස්ථාවේ 77(2) වගන්තිය යටතේ නියම කර ඇති පරිදි ඉහත කී යෝජිත සංශෝධනයන් සම්බන්ධයෙන් 11වැනි වගඋත්තරකාර කථානායක වෙත සිය මතය දන්වා නොතිබූ බවත්, 11වැනි වගඋත්තරකාර කථානායක වෙත එය ලැබී තිබුණේවත් නැති බව පෙත්සම්කරු තරයේ විශ්වාස කරයි.

(ඈ) ඉහත කී පරිදි ඇතුළත් කළ, ඉහත කී 3වැනි උපවගන්තිය, එවැනි ගණුදෙනු 2002.03.13 දිනට පෙර සිදුවී ඇති බව හැඟී යන්නා වූ හෙයින්, අද වුවත් සහ/හෝ අනාගත දිනෙක වුවත් නරකින් සිදුකළ කවර හෝ විනිමය පාලන උල්ලංඝණය කිරීමකට සහ/හෝ වංචා කිරීමකට වැදගත් ලෙස මුක්තිය ලබා දෙයි.

(ඉ) වෙනත් වචනවලින් කියතොත්, එය, වෙනත් දේ අතර, මත්ද්‍රව්‍ය/මත් ඖෂධ තැනින් තැනට ගෙනගොස් විකිණීමට, නීති විරෝධී මිනිස් ප්‍රවාහනයට, ත්‍රස්තවාදයට සහ/හෝ ත්‍රස්තවාදීන්ට සහ/හෝ ත්‍රස්තවාදී ආයතන යනාදියට ද අදාල ගණුදෙනුවලට සම්බන්ධ වියහැකි සහ වන්නාවූ විනිමය පාලන කඩකිරීම් සහ/හෝ වංචා නරකින් සිදුකිරීම පිණිස සම්පූර්ණ අවසරය දෙන, බේරා ගන්නා අසීමිත බලපත්‍රයක් දෙයි.

(ඊ) (ඒ3) පනත් කෙටුම්පතේ ඉහත කී 3වැනි උපවගන්තිය අඩංගු නොවන අතර, එමනිසා, ව්‍යවස්ථාවේ 78 වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබ නොතිබුණි.

(උ) ව්‍යවස්ථාවේ 78 වැනි වගන්තියෙන් නියෝග කර ඇති පරිදි, ඉහත කී ප්‍රධාන ප්‍රමාදදෝෂය සම්පූර්ණ (ඒ3) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ බවට පමුණුවන්නේය.

(ඌ) මෙහි ඉහත ප්‍රකාශ කළ හේතුන්වලට අමතරව, ඉහත කි පරිදි දී ඇති තොරතුරු සහ කාරණා සම්බන්ධයෙන්, ව්‍යවස්ථාවේ 121 සහ 78 වගන්ති ප්‍රකාර (ඒ3) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නිගමනයන් කරන ලෙසට ඉල්ලා සිටීමට ඔබතුමාණන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය අයැද සිටීමට පෙත්සම්කරුට හිමිකම තිබෙන බවට පෙත්සම්කරුට උපදෙස් ලැබී ඇත.

37. පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කරයි:-

(අ) <u>(ඒ3) පනත් කෙටුම්පතට තිබෙන උපලේඛණයේ ලැයිස්තුගත කර ඇති නීති කඩකරමින් පැන නගින,</u> නීත්‍යානුකූලව ලැබිය යුතු <u>ආදායම් එකතු කර ගැනීමට</u> 14වැනි, 15වැනි, 16වැනි, 17වැනි සහ 18වැනි වගඋත්තරකාර ප්‍රධානත්වය දරණ ව්‍යවස්ථාපිත ආයතනවලට <u>නොහැකිය</u> යන පූර්වාවයවය මත (ඒ3) පනත් කෙටුම්පත 2වැනි වගඋත්තරකාර මුදල් ඇමතිවරයා විසින් විවාද කරනු ලැබ ඇති බව පෙත්සම්කරුට හැඟී යයි.

(ආ) රජයට නීත්‍යානුකූලව ලැබිය යුතු ආදායම් පිලිබඳ වූ නිසි සහ සුදුසු එකතු කිරීම සහතික කරමින් ඉහත කී ව්‍යවස්ථික බලමණ්ඩලවලට ඵලදායීව කාර්යයන් කිරීම පිණිස නියෝග කිරීම සම්බන්ධයෙන් මුදල් ඇමති වශයෙන් සිය කාර්යයන්, රාජකාරි සහ වගකීම් ඉටුකිරීමට ඔහුට නොහැකිය යන්න ඉහත කී පූර්වාවයවයම මුදල් අමාත්‍ය 2වැනි වගඋත්තරකරු විසින් පිළිගනු ලැබ ඇති කරුණක් වෙයි.

(ඇ) ඇත්ත වශයෙන්ම, ඉහත කාරණා නිසි ආදායම් එකතු කිරීම ක්‍රියාත්මක කරමින් සහ නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක කරමින්ද, වැරදි කරන්නවුන්ට/නීතිය කඩන්නන්ට නඩු පවරමින්ද, ඵලදායි ලෙස ආණ්ඩු කිරීමට ආණ්ඩුවේ නොහැකියාව පිලිබඳව ආණ්ඩුව විසින් ස්වයංව පිළිගනු ලැබූ චෝදනා පත්‍රයකට සමාන වන අතර, (ඒ3) පනත් කෙටුම්පත රජයේ රාජකාරි සහ වගකීම් අත්හැර දැමීම පමණක් පෙන්නුම් කරයි.

(ඇ) එකී ව්‍යවස්ථාපිත බලමණ්ඩලවල රජයේ නිලධාරින්ට දැරීමට ඔවුන් මත වැරදිසහගත ලෙස සහ නීති විරෝධී ලෙස ගෙන එනු ලැබ ඇති සමාජ-දේශපාලන බලපෑම් තිබියදීත් ඒ ගැන නොසලකා වුවත්, එකී ව්‍යවස්ථාපිත බලමණ්ඩල පසුගිය දශක කිපයේදී සතුටුදායක ලෙස ක්‍රියාත්මක වෙමින් තිබී ඇත.

(ඉ) සිය එක් එක් බලමණ්ඩල විසින් ඉහත කී අතිවිශාල ආදායම් එකතු කිරීමට නොහැකිද, නොහැකි නම්, එම රජයේ නිලවල දිගටම සිටීමට ඔවුන්ට ඉඩදිය යුත්තේ ඇයිද යනුවෙන් හේතූන් පෙන්වන ලෙසට ගරු කටයුතු ඔබ උතුමන්ලාගේ අධිකරණයට සැළකර සිටීමට 14වැනි, 15වැනි, 16වැනි, 17වැනි සහ 18 වැනි වගඋත්තරකරුවන්ගෙන් ඉල්ලා සිටිය යුතුය.

(ඊ) ඇත්ත වශයෙන් අග විනිසුරු, ගරු කටයුතු ඔබ උතුමානන්ගේ විෂය ප්‍රමාණය ඇතුළතට ගැනෙන අධිකරණ විසින් සැලකිය යුතු නඩු ගණනාවක් සාර්ථක ලෙස අවසන් කරනු ලබැ ඇති අතර, එම අධිකරණ විසින් පනවනු ලැබ ඇති දඩ අයකර එකතුකර ගැනීමට ඇත. අධිකරණ මගින 'ක්‍රියාත්මක කිරීමට තිබෙන ව්‍යවස්ථාවේ නිදන්ගත කොට ඇති ජනතාවගේ අධිකරණ බලය අත්හැරිය නොහැක. නැතහොත් මෙලෙස සහ අනන්‍යකාරයෙන් අවලංගු කළ නොහැකිය.

32 පෙත්සම්කරු මෙසේ ප්‍රකාශ කරයි :-

(අ) " <u>පවතින බදු</u> නීති එවැනි පුද්ගලයින් විසින් අනාගතයේදී නීති වලට යටත්වීම ස්ථිර කිරීමේ අදහසක් ඇතිව " (අවධාරණය කිරීම එකතු කරන ලදී) පනත් කෙටුම්පතේ විධි විධාන නීති ගත කරනු ලබන (ඒ3) පනත් කෙටුම්පතේ පෙරවදන විශේෂයෙන් ප්‍රකාශ කරයි.

(ආ) මෙහි ඉහත වඩාත් සම්පූර්ණ ලෙස දක්වා ඇති (ඒ3) පනත් කෙටුම්පතේ, උපලේඛණගත කර ඇති නීතිවල විධිවිධානවලින් සෞභාග්‍යයන් ප්‍රදානය කිරීමට ඇති එවැනි පුද්ගලයින් විසින් අනාගතයේදී යටත්වීම ස්ථිර කිරීම සහතික කිරීමට (ඒ3) පනත් කෙටුම්පතේ කවර හෝ විධිවිධානයක්වත් ඇත.

(ඇ) එහෙත්, ඊට පටහැනිව මෙහි ඉහත වඩාත් සම්පූර්ණ ලෙස දක්වා ඇති පරිදි <u>අනාගතයේදී වුවත් රජයට විනිමය පාලන නීති කඩකිරීම් සහ වංචාවන් දිගටම සිදුකිරීමට,</u> එවැනි ක්‍රියාවන් සිදු කරනු ලැබ ඇත්තේ, 2002.03.31 දිනට පෙර යන්න හඟවමින්, (ඒ3) පනත් කෙටුම්පත විනිමය පාලන නීති කඩකරන්නන්ට_සහ වංචාකරුවන්ට ඉඩකඩ සලසා ඇත.

(ඇ) මෙහි ඉහත සඳහන් කළ සාපරාධී වරදවල් සම්බන්ධයෙන්, සමාව දීමට සිටින එවැනි පැහැර හරින්නන්/වංචාකරුවන් විසින් අනාගතයේදී එම වංචාවන් සිදුකරනු ලැබුවහොත්, නැවත පැනවීමට ඇති දඬ සහ/හෝ දඩුවම් අත්හිටුවීම සඳහා විධි විධාන නොමැත.

(ඉ) ආදායම් එකතුකර ගැනීම් අත්හැරීම පිලිබඳ වු අවස්ථාවේදිත්, (ඒ3) පනත් කෙටුම්පතේ එසේ ප්‍රකාශ කර ඇති පරිදි, එවැනි පුද්ගලයින් අනාගතයේදී නීතියට යටත්වීම ස්ථිර කිරීම පිණිස, එවැනි පුද්ගලයින් අනාගතයේදී ආදායම් නීති සමාන ලෙස කඩකරයි නම්, අත්හැර දැමු එම ආදායම් නැවත පනවන්නේ යැයි, නීතියෙන්, එවැනි පුද්ගලයින්ගෙන් පොරොන්දුවක්වත් ලබාගැනීම පිණිස විධිවිධාන නැත.

(ඊ) රට පටහැනිව, දැනට තිබෙන පරිදි, වංචා කළ එවැනි ආදායම් අත්හැර දැමීමට සහ අපරාධ වලට සමාව දීමට, එවැනි පුද්ගලයින්ගේ දේශපාලන දැනමුත්තන් විසින් ඕනෑම අවස්ථාවක, බලපෑම් ඇති කිරීමට, දේශපාලකයින් කැමති කරවා ගැනීම සහ නීති පැනවීමට සැලැස්වීම යනාදි බලාපොරොත්තු ඇතිව, එවැනි පුද්ගලයින්ට රජයට දිගටම වංචා කිරීමට හැකිවන්නේය යන්න පැහැදිලිව සංඥාව සහ පණිවුඩය වෙයි.

(උ) සැලකිය යුතු ලෙස, ඉහත කී පෙරවදන පවතින බදු නීති වලට අනාගත යටත්වීම ස්ථිර කිරීම පමණක් අදහස් කරන අතර, (ඒ3) පනත් කෙටුම්පතට උපලේඛණගත කර ඇති වෙනත් නීති වලට යටත් නොවෙයි.

39. පෙත්සම්කරු පහත සඳහන් කාරණාවලට ගරු කටයුතු ඔබ උතුමන්ලාගේ අවධානය ගෞරවපූර්වකව යොමු කරයි:-

(අ) (ඒ3) පනත් කෙටුම්පතේ 8වැනි වගන්තිය මෙසේ ප්‍රකාශ කරයි:-

"(අ) (1) මෙම පනතින් නියම කිරීමට තිබෙන අවශ්‍ය කරන්නාවූ සියළු කාරණා සම්බන්ධයෙන් හෝ මෙම පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස මෙම පනත යටතේ අවශ්‍ය කරන්නා වූ හෝ ඇති කිරීමට බලය දෙන්නා වූ රෙගුලාසි පිලිබඳව ඇමතිවරයාට රෙගුලාසි සෑදිය හැකිය.

(2) ඇමතිවරයා විසින් සාදනු ලැබූ සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළකළ යුතු අතර, ප්‍රසිද්ධියට පත්කළ දිනයේ හෝ එහි නියම කිරීමට ඉඩ ඇති පරිදි එවැනි පසු දිනෙක ක්‍රියාත්මක වන්නේය.

(3) ඇමතිවරයා විසින් සාදන ලද සෑම රෙගුලාසියක්ම, ඒවා ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසුව, ඉක්මණින් පහසු පරිදි, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතුය. එසේ අනුමත නොකළාවූ සෑම රෙගුලාසියක්ම, එසේ අනුමත නොකළ දිනයේ සිට, එහෙත් ඒ යටතේ කලින් සිදුකළ ඕනෑම දෙයකට අගති රහිතව අහෝසි වු බව හැගිය යුත්තේය. (අවධාරණය කිරීම එකතු කරන ලදී).

(4) එසේ අහෝසි කළ බවට හැඟී යන්නා වු හෝ රෙගුලාසියක දිනය පිලිබඳ දැනුම්දීම ගැසට් පත්‍රයේ පළ කල යුත්තේය"

තවද, උපදෙස් ලැබී ඇති පරිදි, පෙත්සම්කරු ගෞරවපූර්වකව මෙසේ ප්‍රකාශ කරයි:-

(ආ) අවශ්‍ය කරන සියළු කාරණා සම්බන්ධයෙන් රෙගුලාසි තැනීමට, ඉහත කී වගන්තිය 2වැනි විත්තිකාර මුදල් ඇමතිවරයා වෙත පරීක්ෂා කිරීමකින් තොර අසීමිත බලයක් ප්‍රදානය කරන අතර, ගැසට් පත්‍රයේ පලකරන පරිදි, එම රෙගුලාසි ක්‍රියාත්මක වන්නේය,

(ඇ) එකී ගැසට් කළාවූ රෙගුලාසි ප්‍රකාශය පත් කළාට පසු, පහසු පරිදි, එම රෙගුලාසි

අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට, 8වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය 2වැනි වගඋත්තරකාර මුදල් ඇමතිවරයාට නියම කරයි.

(ඈ) සැක කටයුතු ලෙස, 2වැනි වගඋත්තරකාර මුදල් ඇමතිවිසින් ගැසට් කරන ලද හා පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද රෙගුලාසි, පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත නොකළ දිනයේ සිට, පාර්ලිමේන්තව විසින් අනුමත නොකරන ලද එවැනි රෙගුලාසි යටතේ කලින් සිදුකළ ඕනෑම දෙයකට අගති රහිතව, අහෝසි වන බවට හැඟි යන්නේය යනුවෙන් ඉහත කී (3) වැනි උපවගන්තිය නියම ද කරයි.

(ඉ) යම් විශේෂ පුද්ගලයෙකුට/යන්ට යෝග්‍යවීම සහ/හෝ අනුග්‍රහය දැක්වීම සහ/හෝ උදව් කිරීම පිණිස වැරදිසහගත ලෙස හසුරුවීමට ඉහත කාරණා 2වැනි වගඋත්තරකාර මුදල් ඇමතිවරයා වෙත පරීක්ෂා කිරීමකින් තොර සහ අසීමිත බලතල ප්‍රදානය කරන අතර, එම රෙගුලාසි පාර්ලිමේන්තුව අනුමත නොකර සිටියත්, ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය යටතේ සලස්වා ඇති සියළු පුද්ගලයින්ට එක සමානකමට ඇති අයිතිවාසිකම පැහැදිලිව කඩකරමින්, පාර්ලිමේන්තුව විසින් අනුමත නොකළ එවැනි නීති විරෝධී රෙගුලාසි යටතේ නරකට සිදු කළාවූ ක්‍රියාවන් නීත්‍යානුකූලව පවතී.

(ඊ) ඉහත සඳහන් කාරණාවලින්, ව්‍යවස්ථාවේ 4වැනි වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තුව විසින් ක්‍රියාවේ යොදවනු ලැබීමට තිබෙන ජනතාවගේ ව්‍යවස්ථාපිත බලය, 2වැනි වගඋත්තරකාර මුදල් ඇමතිවරයා විසින් මෙහෙවන ලෙසින් බලෙන් අල්ලාගෙන ඇත අතර, ව්‍යස්ථාවේ 3වැනි වගන්තිය ප්‍රකාර අන්සතු කළ නොහැකි ජනතාවගේ පරමාධිපත්‍ය එකී විධි විධාන මගින් අන්සතු කර ඇත.

(උ) එපමණක්ද නොව, ඉහත කරුණු වලින්, පාර්ලිමේන්තුව සිය ව්‍යවස්ථාපිත බලය අත්හැර නොදැමිය යුතුය, නැතහොත්, කවර හෝ ආකාරයකින්වත් අන්සතු නොකළ යුතුය" යනුවෙන් නියම කර ඇත්තාවූ ව්‍යවස්ථාවේ 76(1) වගන්තිය උල්ලංඝණය වන අතර, (ඒ3) පනත් කෙටුම්පතේ එකී 8වැනි වගන්තිය ප්‍රකාර 2වැනි වගඋත්තරකාර මුදල් ඇමතිවරයාට දී ඇති බලතලවල අවිශේෂ ස්වභාවය නිසා ව්‍යවස්ථාවේ 76(3) වගන්තියේ විධිවිධානවලට පටහැනිත් වෙයි.

(ඌ) " ව්‍යවස්ථාවට 18වැනි සංශෝධනය" යන මාතෘකාව සහිත පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගරු කටයුතු ඔබ උතුමන්ලාගේ අධිකරණයේ සත් සාමාජික විනිශ්චය මඩුල්ලක් විසින් එකමතිකව කළ නිගමනයේදී වෙනත් දේ අතර, පහත සඳහන් පරිදි ද තීන්දු කරන ලදි:-

" මහජනතාව විශ්වාසය තබා ඇති සහ පාර්ලිමේන්තුව විසින් භාවිතා කරනු ලබන, ව්‍යවස්ථාවේ 4(අ) වගන්තිය අනුව පවතින්නා වූ ව්‍යවස්ථාපිත බලය භාවිතා කිරීමට යෝජිත සංශෝධණය සභාව හැකියාව ලබාදෙයි, පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාපිත බලය අත්හැර දැමීමට හෝ අන්සතු කිරීමට නොහැකිය. . ..මෙලෙස යෝජිත සංශෝධනය, අනෙක් අතට මහජනයාගේ ස්වෛරීත්වයට බලපාන අත්හැර දැමීමක් මෙන්ම අන්සතු කිරීමක් වන්නා වූ ව්‍යවස්ථාවෙන් පිහිටුවා ඇති ආයතනයක නීති සෑදීමේ බලතල මත ඇති පාර්ලිමේන්තු පාලනය බිඳ හෙළයි. මෙය ව්‍යවස්ථාවේ 3වැනි සහ 4වැනි වගන්තිවලට ප්‍රතිවිරුද්ධ වෙයි"

40. ගනන් කෙටුම්පත යටතේ රෙගුලාසි සෑදීම පිණිස ඇති 2වැනි වගඋත්තරකාර මුදල් ඇමතිවරයාගේ බලය පිලිබඳ වු ඉහත කී භාවිතය, ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය යටතේ සමානකමට ඇති පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම කඩවීම නොවැලැක්විය හැකි බවත්, මෙලෙස ව්‍යවස්ථාවේ 17වැනි වගන්තියේ අර්ථය ඇතුළත ආසන්නතම කඩකිරීමක් ලෙස සලකනු ලබන බවත්, ඒ සම්බන්ධයෙන් ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය අයැද සිටීමට තමාට හිමිකම තිබෙන බවත් පෙත්සම්කරු ප්‍රකාශ කරයි.

41. ඉහත 39වැනි ඡේදයේ කරුණු වශයෙන් ඉදිරිපත් කර ඇති හේතූන් නිසා හා ඊටත් වැඩියෙන්, (ඒ3) පනත් කෙටුම්පතේ සම්පූර්ණ අදහසම, රජයට සහ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මහජනයාට කළ වංචාවක්ද, පොදු සාරධර්ම සහ කාලය නිසා සම්මානනීය වූ රටේ පොදු ප්‍රතිපත්තිය පිලිබඳ වූ දූෂණයක් ද වන නිසා ඉහත කී පරිදි ආසන්නතම කඩකර්මක් සිදුවෙතැයි ඔහු සැක කරන බව පෙත්සම්කරු ප්‍රකාශ කරයි. මෙම පසුබිම සම්බන්ධයෙන්, (ඒ3) පනත් කෙටුම්පතේ විධි විධාන වලට බලය ලබා දීමට කරනු ලබන කවර හෝ රෙගුලසි පෙත්සම්කරුගේ හා ශ්‍රී ලංකාවේ මහජනයාගේ මූලික අයිතිවාසිකම් කඩවීම වැලැක්විය නොහැක්කේය.

42. නොහැකියාවක් හේ නිශ්චල කිරීමක් හෝ අනන්‍යකාරයකින් පනත් කෙටුම්පත එයේ ඉදිරිපත් කර දින හතක් (7) ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පනත් කෙටුම්පතකට අභියෝගයක් නොතිබුණේය යන හුදු තාක්ෂණික හේතුවක් මත, අගති සහ/හෝ නීති විරෝධී සහ/හෝ ව්‍යවස්ථානුකූල නොවන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම පමණක්, එවැනි පනත් කෙටුම්පතක් ව්‍යවස්ථානුකූලව වලංගු සහ/හෝ නීත්‍යානුකූල නීති වන්ධයක් විය නොහැකි බව පෙත්සම්කරු ගෞරවපූර්වකව ප්‍රකාශ කර සිටි.

43. පෙත්සම්කරු උපදෙස් ලැබී ඇති පරිදි, මෙසේ ප්‍රකාශ කරයි:-

(අ) ව්‍යවස්ථාවේ වගන්ති හා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් නිගමනයන් කිරීම පිණිස ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට පැවරී ඇති අධිකරණ බලය ප්‍රකාර ගරු කටයුතු ඔබ උතුමානන්ලාගේ අධිකරණය විසින් කරනු ලැබ ඇති නොයෙක් නිගමනයන් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය නීතියේ කොටස් වශයෙන් සමන්විත වෙයි.

(ආ) ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ හත් (7) සාමාජක විනිශ්චය මඩුල්ලක් විසින් " ව්‍යවස්ථාවේ 18වැනි සංශෝධනය" සහ " ව්‍යවස්ථාවේ 19වැනි සංශෝධනය" යනුවෙන් නම්කළ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කරන ලද නිගමනයක් 2002 ඔක්තෝම්බර් මස තරම් මෑතකදී කරන ලදී.

(ඇ) (ඒ3) පනත් කෙටුම්පත ක්‍රමවත්ව සකස් කරනු ලැබ ඇත්තේ, සම්පූර්ණයෙන්ම ඊට පසු ආසන්නයේදීමය.

(ඈ) ඉහත කී පරිදි ගරු කටයුතු ඔබඋතුමානන්ලාගේ අධිකරණය විසින් ඉහත කී කලින් කරන ලද නිගමනයන්ට අමතරව, 2002 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ තරම් මෑතකදී ගරු කටයුතු ඔබ උතුමාණනන්ලාගේ අධිකරණය විසින් කරන ලද ඉහත නිගමන දෙක (ඒ3) පනත් කෙටුම්පත ක්‍රමවත්ව සැකසීමේදී සහ නීතිගත කිරීමේදී සැලකිල්ලට ගතයුතුව හා පිලිපැදිය යුතුව තිබුණි.

(ඉ) (ඒ3) පනත් කෙටුම්පත ක්‍රමවත්ව සැදීමට හා නීතිගත කිරීමට වගකිව යුතු අය 2002 ඔක්තෝම්බර් මාසයේදී ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ හත් (7) සමාජක විනිශ්චය මණ්ඩල දෙක විසින් කරන ලද ඉහත කී නිගමන දෙකට ගරු කිරීමට හා එම නිගමන දෙකේ සිද්ධාන්ත කල්පනාවට ගැනීමට අපොහොසත්ව පැහැ රහැර ඇත.

(ඊ) ඒ අනුව, ව්‍යවස්ථාවේ විධි විධාන වලට හා නීති නීතිගත කිරීමට අදාළවීම සම්බන්ධව ගරු කටයුතු ඔබ උතුමානන්ලාගේ අධිකරණයේ ඉහත නිගමනවලට පටහැනි වන්නාවූ සහ එම නිගමනයන් කඩකරන්නාවූ විධි විධාන (ඒ3) පනත් කෙටුම්පතේ අඩංගු වෙයි.

44. මෙහි ඉහත තරයේ ප්‍රකාශ කොට ඇති කරුණුවල බැරෑරුම්කම සහ බරපතලකම නිසාද, ව්‍යවස්ථාවේ නිදන් කොට ඇති පරිදි මහජනතාවගේ අයිතිවාසිකම් සහ මහජනතාවගේ යහපත තහවුරු කිරීම පිණිස, ව්‍යවස්ථාව ස්ථිර කිරීමට හා ආරක්ෂා කිරීමටද, මහජනතාගේ අධිකරණමය බලය සහතික කිරීම පිණිස සහ ඔවුන්ගේ ස්වෛරීත්වය අන්සතු නොකිරීමට විනිශ්චයකාර නිළයේ ගාම්භිරතා දිවුරුම/ප්‍රතිඥාව මගින් ගරු කටයුතු ඔබ උතුමාණන්ලා බැඳී ඇති අතර, ව්‍යවස්ථාව ස්ථිර කිරීමේ සහ ආරක්ෂා කිරීමේ යහපත උදෙසා, ඒ මගින්, අන්සතු කළ නොහැකි මහජනතාවගේ ස්වෛරීභාවය රැකබලා ගනිමින් සහ ආරක්ෂා කරමින්, ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ නෛසර්ගික අධිකරණ බලය ක්‍රියාත්මක කරන ලෙසට පෙත්සම්කරු උදක්ම ගෞරවපූර්වකව ඉල්ලා සිටියි.

" ව්‍යවස්ථාවේ 18වැනි සංශෝධනය" සහ " ව්‍යවස්ථාවේ 19වැනි සංශෝධනය" යනුවෙන් නම්කළ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කරන ලද නිගමනයක් 2002 ඔක්තෝම්බර් මස තරම් මැතකදී කරන ලදී.

(ඇ) (ඒ3) පනත් කෙටුම්පත ක්‍රමවත්ව සකස් කරනු ලැබ ඇත්තේ, සම්පූර්ණයෙන්ම ඊට පසු ආසන්නයේදීමය.

(ඈ) ඉහත කී පරිදි ගරු කටයුතු ඔබ උතුමානන්ලාගේ අධිකරණය විසින් ඉහත කී කලින් කරන ලද නිගමනයන්ට අමතරව, 2002 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ තරම් මැතකදී ගරු කටයුතු ඔබ උතුමාණනන්ලාගේ අධිකරණය විසින් කරන ලද ඉහත නිගමන දෙක (ඒ3) පනත් කෙටුම්පත ක්‍රමවත්ව සැකසීමේදී සහ නීතිගත කිරීමේදී සැලකිල්ලට ගතයුතුව හා පිළිපැදිය යුතුව තිබුණි.

(ඉ) (ඒ3) පනත් කෙටුම්පත ක්‍රමවත්ව සැදිමට හා නීතිගත කිරීමට වගකිව යුතු අය 2002 ඔක්තෝම්බර් මාසයේදී ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ හත් (7) සමාජික විනිශ්චය මණ්ඩල දෙක විසින් කරන ලද ඉහත කී නිගමන දෙකට ගරු කිරීමට හා එම නිගමන දෙකේ සිද්ධාන්ත කල්පනාවට ගැනීමට අපොහොසත්ව පැහැ රහැර ඇත.

(ඊ) ඒ අනුව, ව්‍යවස්ථාවේ විධි විධාන වලට හා නීති නීතිගත කිරීමට අදාළවීම සම්බන්ධව ගරු කටයුතු ඔබ උතුමානන්ලාගේ අධිකරණයේ ඉහත නිගමනවලට පටහැනි වන්නාවූ සහ එම නිගමනයන් කඩකරන්නාවූ විධි විධාන (ඒ3) පනත් කෙටුම්පතේ අඩංගු වෙයි.

44. මෙහි ඉහත තරයේ ප්‍රකාශ කොට ඇති කරුණුවල බැරෑරුම්කම සහ බරපතලකම නිසාද, ව්‍යවස්ථාවේ නිදන් කොට ඇති පරිදි මහජනතාවගේ අයිතිවාසිකම් සහ මහජනතාවගේ යහපත තහවුරු කිරීම පිණිස, ව්‍යවස්ථාව ස්ථිර කිරීමට හා ආරක්ෂා කිරීමටද, මහජනතාගේ අධිකරණමය බලය සහතික කිරීම පිණිස සහ ඔවුන්ගේ ස්වෛරීත්වය අන්සතු නොකිරීමට විනිශ්චයකාර නිළයේ ගාම්භිරතා දිවුරුම/ප්‍රතිඥාව මගින් ගරු කටයුතු ඔබ උතුමාණන්ලා බැඳී ඇති අතර, ව්‍යවස්ථාව ස්ථිර කිරීමේ සහ ආරක්ෂා කිරීමේ යහපත උදෙසා, ඒ මගින්, අන්සතු කළ නොහැකි මහජනතාවගේ ස්වෛරීභාවය රැකබලා ගනිමින් සහ ආරක්ෂා කරමින්, ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ නෛසර්ගික අධිකරණ බලය ක්‍රියාත්මක කරන ලෙසට පෙත්සම්කරු උදක්ම ගෞරවපූර්වකව ඉල්ලා සිටියි.

45. " ව්‍යවස්ථාවේ 19වැනි සංශෝධනය" යන ශිර්ෂය තිබූ පනත් කෙටුම්පත සම්බන්ධ ඒකමතික නිගමනයේදී ගරු කටයුතු ඔබ උතුමානන්ලාගේ අධිකරණයේ සත් (7) සාමාජක විනිශ්චය මණ්ඩලය වෙනත් දේ අතර, පහත සඳහන් පරිදි තීරණය කර තිබූ, ඉන්දියානු නඩු තීන්දුවක් නැවත නැවතත් ප්‍රකාශ කළේය:-

" ව්‍යවස්ථාවේ මුළු රාමුව හරහා ගමන් කරන එක මූලධර්මයක් ඇත. එය නීතියේ ආධිපත්‍ය පිලිබඳ වූ මූලධර්මය වන අතර, රජයේ සෑම අංශයක්ම නීතියේ සීමාව ඇතුලත තබා ගැනීමේ කාර්යභාරය පැවරී ඇත්තේ අධිකරණයට වන අතර, ඒ මගින් නීතියේ ආධිපත්‍ය අර්ථවත් සහ ඵලදායි කරනු ලබයි"

46. ඉහත කී කාරණා තිබෙන හැටියට, මෙම පෙත්සමේ අයැද ඇති සහන ලබා ගැනීම සඳහා ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය අයැද සිටීමට තමන්ට හිමිකම තිබෙන බව පෙත්සම්කරු ගෞරවපූර්වකව අයැද සිටී.

47. අයැද ඇති අතුරු සහන ලබාදුනහොත් මිස, පිරිමැසිය නොහැකි අලාභ සහ හානිද, අප්‍රතිකාර අනර්ථයක්ද සලස්වනු ලබන්නේ යැයි පෙත්සම්කරු තවදුරටත් ප්‍රකාශ කරයි.

48. පෙත්සම්කරු මෙම කාරණය සම්බන්ධයෙන් ගරු කටයුතු ඔබ උතුමානන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය කලින් අයැද නැත.

49. මෙම පෙත්සමේ අඩංගු සම්ප්‍රකාශයන් සනාථ කිරීම සම්බන්ධයෙන් පෙත්සම්කරුගේ දිවුරුම්පත මෙම පෙත්සමට අමුණා ඇත.

එබැවින්, ගරු කටයුතු ඔබ උතුමාණනන්ලාගේ අධිකරණය කාරුණිකව :-

(අ) මෙම ඉල්ලීම ඉදිරියට ගෙන යැම පිණිස, පළමු අවස්ථාවේ, අවසර ලබා දෙන ලෙසට,

(ආ) (ඒ3) පනත් කෙටුම්පත නීතිගත කිරීමේදී, ව්‍යවස්ථාවේ නිදන්ගත කොට ඇති ව්‍යවස්ථාමය විධි විධාන සහ ආරක්ෂාවන් නොපිලිපැදීම නිසා, ව්‍යවස්ථාවේ, 78වන වගන්තිය සමඟ කියැවෙන 121 වැනි වගන්තිය ප්‍රකාර ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය අයැද සිටීමට ඇති අයිතිය පෙත්සම්කරුට අහිමි කරනු ලැබ ඇති බවට හා ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(අ) වගන්ති යටතේ සහතික කර ඇති පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩකරනු ලැබ ඇති බවට ප්‍රකාශ කරමින් නියෝග කරන ලෙසට,

(ඇ) (ඒ3) පනත් කෙටුම්පත ඉහත කී ආකාරයෙන් නීතිගත කිරීම මගින්, ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(අ) වගන්ති මගින් සහතික කර ඇති පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩකරනු ලැබ ඇති බවට නියෝග කරන ලෙසට,

(ඈ) දී ඇති තොරතුරු සහ කරුණු තිබෙන හැටියට, ඉහත කී ආකාරයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ (ඒ3) පනත් කෙටුම්පතේ සමහර විධිවිධාන ව්‍යවස්ථාවේ නොයෙක් වගන්තිවල බලය ඉක්මවා යන බවට හා එම පනත් කෙටුම්පත නීත්‍යානුකූලව නීතිගත කිරීමට හැකියාව නොතිබූ බවට ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයෙන් නිගමනයන් ඉල්ලා සිටීමට ව්‍යවස්ථාවේ 78 වැනි වගන්තිය සමඟ කියැවෙන 121 වගන්තිය ප්‍රකාර ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ අධිකරණ බලය අයැද සිටීමට පෙත්සම්කරුට හිමිකම් ඇති බවටද ප්‍රකාශ කරමින් නියෝග කරන ලෙසට,

(ඉ) ඉහත කී ආකාරයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ ඇති (ඒ3) පනත් කෙටුම්පතේ 7වැනි වගන්තියේ විධි විධාන සලකා ඇති පරිදි 2වැනි වගඋත්තරකාර, මුදල් ඇමතිවරයා රෙගුලාසි ප්‍රකාශයට පත් කළහොත්, ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(අ) වගන්ති යටතේ පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වන්නේය යනුවෙන් ප්‍රකාශ කරමින් නියෝගයක් ලබා ගැනීමට,

(ඊ) මෙම ඉල්ලීම පිලිබඳව අවසාන නිගමනය කරනතුරු ඉහත කී ආකාරයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කරගනු ලැබූ (ඒ3) පනත් කෙටුම්පතේ 8වැනි වගන්තිය යටතේ රෙගුලාසි සෑදීමෙන් 2වැනි වගඋත්තරකාර මුදල් ඇමති සහ/හෝ ඔහුගේ සේවකයින්, ඒජන්තවරුන් සහ නියෝජිතයන් වලක්වාලමින් අතුරු නියෝග කරන ලෙසට,

(උ) මෙම ඉල්ලීම පිලිබඳව අවසාන නිගමනය කරන තුරු (ඒ3) පනත් කෙටුම්පතේ 8වැනි වගන්තිය යටතේ දැනමටත් සාදා ඇති යම් රෙගුලාසි, ක්‍රියාත්මක කිරීම නවත්වමින්, අතුරු නියෝගයක් කරන ලෙසට,

(ඌ) (ඒ3) පනත කෙටුම්පත් සම්බන්ධයෙන් අනුගමනය කිරීමට තිබෙන නීතියෙන් නියම කර ඇති සියළුකාර්ය පර්පාටිවලට අදාල සියළු ලිපිගොනු, ලියවිලි සහ වාර්තා ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයේ ඉදිරිපත් කරන ලෙසට 2වැනි වගඋත්තරකාර මුදල් ඇමතිවරයාට සහ 6වැනි වගඋත්තරකාර ලේකම්වරයාට නියම කරමින් අතුරු නියෝගයක් කරන ලෙසට,

(එ) (ඒ3) පනත් කෙටුම්පතේ විධි විධාන පරිදි 14වැනි, 15වැනි, 16වැනි, 17වැනි සහ 18වැනි වගඋත්තරකරුවන් ඔවුන් එකිනෙකා විසින් අපේක්ෂා කරන ලද ආදායම් අහිමිවීමේ ප්‍රමාණය සහ මෙම පෙත්සමේ දිනය වන විට (ඒ3) පනත් කෙටුම්පතට තිබෙන උපලේඛණයේ දක්වා ඇති එක් එක් නීති යටතේ සහ ප්‍රකාර පවරනු ලැබ ඇති සහ පවරනු ලැබීමට ඇති සාපරාධී නඩුවල ලැයිස්තුවකුත් ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණය ඉදිරියේ ඉදිරිපත් කරන ලෙසට 14වැනි, 15වැනි, 16වැනි, 17වැනි සහ 18වැනි වගඋත්තරකරුවන්ට නියම කරමින් අතුරු නියෝගයක් හා රජයට නීත්‍යානුකූලව ලැබීමට තිබෙන එම ආදායම් එකතු කිරීමටද, එකී සාපරාධී නඩු ඉදිරියට ගෙන යැමටද ඔවුන්ට නියම කරන ලෙසට,

(ඒ) ව්‍යවස්ථාපිත ලැබීමට තිබෙන මුදල් හා අධිකරණ විසින් පනවන ලද දඩ මුදල් යන දෙකෙන් ඉහත කී ආදායම් වලින් කුමන ආදායම් ඔවුන්ට එකතු කරගත නොහැකිද යන්න ප්‍රකාශ කරන ලෙසට 14වැනි, 15වැනි, 16වැනි, 17වැනි සහ 18වැනි වගඋත්තරකරුවන්ට නියම කරමින් අතුරු නියෝගයක් ලබාදෙන ලෙසට,

(ඔ) අල්ලස් හෝ දූෂණ විමර්ශණ පනතේ අර්ථය ඇතුලතට වැටෙන " රජයේ සේවකයින්" විසින් කරන ලද ප්‍රකාශ, අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවේ සභාපති, 20වැනි වගඋත්තරකරුට ඉදිරිපත් කරන ලෙසට 1වැනි වගඋත්තරකාර දේශිය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත නියම කරමින් සහ/හෝ එවැනි " රජයේ සේවකයින්" විසින් කරන ලද සියළු ප්‍රකාශ 14වැනි වගඋත්තරකාර දේශිය ආදායම් කොමසාරිස් ජෙනරාල්ගෙන් කැඳවන ලෙසට 20වැනි වගඋත්තරකාර අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවේ සභාපතිට නියම කරමින් හා එවැනි ප්‍රකාශසම්බන්ධයෙන් සියළු නියමිත ක්‍රියාවන් ගැනීමට 20වැනි වගඅත්තරකාර අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවේ සභාපතිට නියම කරමින්ද නියෝග කරන ලෙසට,

(ඕ) (ඒ3) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සිදුවී ඇති දේ කවර හෝ අයුරකින් නැවත සිදුවීම වැළැක්වීම පිණිස, එවැනි පනත් කෙටුම්පත්වල අඩංගු කාරණා සහ ගැටළු පිලිබඳව මහජනයාට දැන ගැනීමට සහ සැළකිලිමත් වීමට හැකිවන සේ පාර්ලිමේන්තුවට ඉදිපත් කිරීමට තිබෙන පනත් කෙටුම්පත් පිලිබඳව මහජනවාතට නිසි, පුළුල් සහ කලට වේලාවට ප්‍රසිද්ධිය ලබා දීම පිණිස ගරු කටයුතු ඔබ උතුමාණනන්ලාගේ අධිකරණය විසින් අනුමත කිරීමට ඉඩ ඇති පරිදි, රීති සහ උපදෙස් නියම කිරීමට 11වැනි සහ/හෝ 13වැනි වගඋත්තරකරුවන්ට නියම කරමින් නියෝග කරන ලෙසට,

(ක) වගඋත්තරකරුවන්ගෙන් කවර හෝ එක් අයෙක් හෝ වැඩි දෙනෙක් ව්‍යවස්ථාව සහ නීතිය අනුව ඔවුන්ගේ රාජ්‍ය නිලයේ කාර්යයන් කිරීමට හෝ ඉටු කිරීමට අපොහොසත් වී ඇති බවට හා ඉහත කී ආකාරයට (ඒ3) පනත් කෙටුම්පත නීතිගත කිරීම සම්බන්ධව සහභාගි වීමේදී ව්‍යවස්ථාව පිළිගැනීමට හා ආරක්ෂා කිරීම පිණිස ව්‍යවස්ථාව ප්‍රකාර විදිමත් දිවුරුම/ප්‍රතිඥාව කඩකරමින් ක්‍රියාකර ඇති බවටද, විමසීමකින් අනතුරුව, නියෝග කරන ලෙසට,

(ග) නඩු ගාස්තු ලබා දෙමින් නියෝග කරන ලෙසට හා,

(ච) මහජන යහපතට සහ මහජන සුභසිද්ධියට ඇති ආසන්නතම අනතුර නිසා ඉහත කී පරිදි දැඩි ලෙස ප්‍රකාශ කර දී ඇති තොරතුරු සහ කාරණා සම්බන්ධයෙන් ගරු කටයුතු ඔබ උතුමාණන්ලාගේ අධිකරණයට හැගී යන්නාවු පරිදි එවැනි වෙනත් සහ තවත් සහන ලබාදෙන ලෙසට,

පෙත්සම්කරු ගෞරවපූර්වකව අයදැ සිටී.

පෙත්සම්කරුගේ නීතිඥවරුන්

<u>සකස් කරන ලද්දේ,</u>

නීතිඥ එස්.කනග්‍රේශ්වරන්
නීතිඥ විරාන් කොරයා,
නීතිඥ වින්ද්‍යා වීරසේකර (මිය)
නීතිඥ ඇම්.ඒ සුමන්දිරන්

ජනාධිපති නිතිඥ කේ.කනග්‍රේශ්වරන්,